බුදු දහමෙන් පෝෂණය වූ

# සොඳුරු නායකයා



SIRIKOTHA
LIBRARY
923.2
WIC
001513

සුනිල් ද සොයිසා

6905

PRESIDENTIAL SECRETARIAT
LIBRARY

# බුදු දහමින් පෝෂණය වූ සොඳුරු නායකයා

## ශ්‍රේෂ්ඨ ලංකා පුත්‍රයකුගේ චරිතාපදානය



සුනිල් ද සොයිසා

සහාය - දිලිප් මෙන්ඩිස්

ප්‍රකාශනය

දයානන්ද ගුණතිලක

| | |
|---|---|
| පරි. අංක | 6905 |
| වර්ග අංකය | 920 |
| දිනය | 24.02.2023 |

# පිදුම

තුන්කල් පෙනෙනා ඉසිවර දැක්මය
පොදුජන පැතුමද ඔබ පමණක්මය
ඔබහට කළ හැකි ඉහළම වික්මය
දෙස, බස, රැස සහ සමය ද රැක්මය

සම්භාවනීය බෞද්ධ පරපුරක දේශමාමක ප්‍රතිබිම්බය වූ

අනාගත ශ්‍රී ලංකාව එක්සේසත් කිරීමට නියත විවරණ ලැබූ

**රනිල් වික්‍රමසිංහ**

නම් වූ අභිජාත ලංකා පුත්‍රයාණන්ට

බහුමානයෙන් පිළිගන්වමි.

# පෙළ ගැස්ම


- ප්‍රවේශය 5-8
- කීර්තිමත් පවුල් ඉතිහාසයක පැටිකිරිය 9-12
- එස්මන්ඩ් වික්‍රමසිංහ ගැන කෙටි සටහනක් 13-14
- කවුද මේ රනිල් ? 15
- නාලනී විජේවර්ධන අම්මාගෙන් ලද බෞද්ධ අධ්‍යාපනය 16-22
- රනිල් සංස්කෘතික කටයුතු වලට අත පොවයි 23-30
- රනිල් සහ භික්ෂූන් වහන්සේ අතර බැඳීම 31-32
- මාතා පිතු උපට්ඨානං 33-34
- කලාවට යෙදූ සිත 35-36
- භික්ෂුන් වහන්සේලා රනිල්ව දකින හැටි 37-39
- ඉතිහාසය පිළිබඳ දැනුම 40-41
- රනිල්ගේ ප්‍රතිඥාව 42-43
- උත්තුංග පොරොන්දුවක් 44-45
- රනිල්ට පැරකුම් නිරිඳු ආදේශ කළ හැක්කේ ඇයි? 46-47
- ප්‍රේමයෙන් මන රංජිතවේ නන්දිතවේ 48-49
- පරිසමාප්ත දේශපාලන දර්ශනය 50-54
- ජේ. ආර්. ගේ අත්හදා බැලීම 55-57
- විනෝදකාමී සහෘදයා 58-59
- නායකත්වයට ගරු කිරීම 60-63
- නායකත්වය සඳහා සුදුසුකම් 64-66
- ජනාධිපති අපේක්ෂකයා ලෙස 67-69

අරමුණ...

ප්‍රසිද්ධ පුද්ගලයකුගේ චරිතාපදානය ලියද්දී, ඔහු ළඟින් ඇසුරු නොකොට ඈත සිට ඔහුගේ ගති ලක්ෂණ, චර්යාවන් සහ ක්‍රියාකාරීකම් අධ්‍යයනය කිරීම මැනැවැයි මහා ලේඛක ජී. බී. සේනානායකයන් ප්‍රකාශ කොට තිබේ. එය සත්‍යයක් යැයි මම ද විශ්වාස කරමි.

රනිල් වික්‍රමසිංහ නම් ආන්දෝලනාත්මක දේශපාලන නායකයාගේ මේ චරිතාපදානය ද එසේ ලියවුනකි. බෞද්ධාගම කෙරෙහි ඔහු තුළ පවත්නා ලැදියාව හා භක්තිය සරල ලෙස විමර්ශනය කිරීම මෙම කෘතියේ අරමුණය.

**මෙම කුඩා කෘතිය ලිවීමේදී නන්විද උපදෙස් දුන් ජ්‍යෙෂ්ඨ පුවත්පත් කතුවර මීගල මුදියන්සේ මහතාටත්**, සහෘද එම්. ඒ. පෙරේරා, සුනිල් ගුණරත්න, එච්. එස්. එන්. මෙන්ඩිස් මහතුන්ටත් මුද්‍රණ කටයුතු කර දුන් ආර්ට්වේ මුද්‍රණාලාධිපති ඔස්ටින් දිසානායක මහතා ඇතුළු කාර්ය මණ්ඩලයටත් කෘතඥ වෙමි.

**එක්සත් ජාතික පක්ෂයේ නියෝජ්‍ය මහ ලේකම් තිස්ස අත්තනායක මැතිතුමාටත්, මෙහි ප්‍රකාශනය භාරගත් දයානන්ද ගුණතිලක මහතාට විශේෂ ස්තුතිය හිමි වේ.**

**- සුනිල් ද සොයිසා**

"සිරිකොත",
අංක, 400, කෝට්ටේ පාර,
පිටකෝට්ටේ.

# ප්‍රවේශය

භාරතයේ පමණක් නොව සමස්ත ලෝකයේම අතිශ්‍රේෂ්ඨ නරපතියා වූ ධර්මාශෝක, ධර්ම විජය කළේ කුඩා සාමණේරයාණන් වහන්සේ කෙනෙකුගෙන් බුදු බණ ඇසීමෙන්ය. රාජ්‍යයන් දිග්විජය කොට චණ්ඩාශෝකව සිටි මේ නරපතියා ධර්මාශෝක වූ පසු මහා භාරතයේ රාජ්‍ය ලාංඡනය ධර්ම චක්‍රය බවට තෝරා ගත්තේය. භාරතය ධර්ම රාජ්‍යයක් කොට, සතුන් මැරීම පවා තහනම් කළ හෙතෙම ලෝකයේ රටවල් කිහිපයකටම ධර්ම දූතයන් යවා, එකී රටවල බුද්ධ රාජ්‍යයන් පිහිටුවා ලීය.

එවකට ලංකා රාජ්‍ය පාලනය කළේ, මුටසීව රජුගේ පුත්‍රයා වූ දෙවන පෑතිස්ස හෙවත්, (දෙවියන්ට රිසි වූ හෙයින්ම) දේවානම් පියතිස්ස විය. හෙතෙම ධර්මාශෝකයන්ගේ අසදෘශ මිත්‍රයාණ කෙනෙක්ද වූහ. එහෙයින්ම ධර්මාශෝක ලංකා රාජ්‍යයේ බුද්ධාගම ස්ථාපිත කරනු සඳහා එවනු ලැබුයේ පැවිදි වී රහත් ඵල ලබා සිටි මහින්ද ස්ථවිරයන්ය.

මහින්දාගමනය හෙවත් මිහිඳු මහ රහතන් වහන්සේගේ පැමිණීම වූ කලී, ලංකා රාජ්‍යයේ නව උපත සිදු කරන්නක්

විය. ජාතික, ආගමික, සංස්කෘතික, සමාජීය පරිණාමය ඇති වූයේ එතැන් සිටය.

ගෞතම බුදුන් වහන්සේ තෙවරක් ලංකා රාජ්‍යය, තම ශ්‍රී පාද පහසින් පූජනීය කළද. උන්වහන්සේගේ ධර්මය මෙරට ස්ථාපිත වූයේ මහින්දා ගමනයෙන් පසු දේවානම් පියතිස්ස රාජ්‍ය යුගයේදීය. ධර්මාශෝක නරපතියානන්ගේ දුහිතෘ සංඝමිත්තා රහත් මෙහෙණිය දඹදිව ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ අංකුරයක් රැගෙන ශ්‍රී ලංකා රාජ්‍යයට සම්ප්‍රාප්ත වූවාට පසු මෙහි මෙහෙණි සස්නද ඇති විය. මහින්දාගමනයෙන් සහ දූමින්දාගමනයෙන් අනතුරුව ලංකා රාජ්‍යය, රජවරුන් තිදෙනෙකු විසින් බුද්ධ ශාසනයට සහ සංඝ ශාසනයට පූජා කරන ලදී.

ශ්‍රී දන්ත ධාතුව, ශ්‍රී පාද පද්මය, පාත්‍රා ධාතුව, කේශ ධාතුව, ලලාට ධාතුව, මහ සෑ ගර්භවල නිදන් කර ඇත්තේ මේ ලංකා රාජ්‍යය තුළය. ඒ හෙයින්ම පරම පවිත්‍ර ථේරවාදී බුද්ධාගම ස්ථාපිත මෙම රාජ්‍යය පූජනීය රාජ්‍යයක් බවට පත් විය.

ඒ නිසාම අපේ ආදී රජවරු සියලු දෙනාම පාහේ මහා සංඝයා සහ පන්සල ඇසුරෙන් රාජ්‍ය බලය පවත්වාගෙන යාමට හැම විටම ක්‍රියා කළහ. මහ දාගැබ්, වෙහෙර විහාර, ගොඩනැගුවේ රජවරුන්ය. ඒවා පාලනය කළේ මහා සංඝයාය, රජවරු එම වෙහෙර විහාර නඩත්තුවට සහ සංඝයාගේ නඩත්තුවට ගම් බිම් පිදූහ.

නායක්කර් වංශික වඩුග රජෙකු වූ, ශ්‍රී වර්ධන පුර හෙවත් සෙංකඩගල රජ කළ කීර්ති ශ්‍රී රාජසිංහයෝ අහෝසි

වී ගිය උපසම්පදාව යළි පිහිටුවීමේ පුරෝගාමීහු වූහ. නායක්කර් වඩුග රජවරුන් පවා මේ සිංහල රටේ සිංහලයන්ගේ පිළිගැනීමට පාත්‍ර වූයේ ඔවුන් නිසි ලෙස බුද්ධාගම වැළඳ දළඳා හාමුදුරුවන්ගේ අයිතිය ලබාගත් හෙයිනි.

පන්සලට ගම් බිම්, දැසි දස්සන්, මුතු මැණික් පිදීම ආරම්භ වූයේ දේවානම් පියතිස්ස රජු, මිහිඳු රහත් හිමියන්ට මහාමේඝ වනය හෙවත් මහමෙවුනාව පිදීමෙන් පසුවය. භික්ෂූන්ට සිව් පසයෙන් පිදීමෙන් රජවරුන් බලාපොරොත්තු වූයේ උන්වහන්සේලාගේ උපදෙස් සහ අනුශාසනාවන්ය. ඇතැම් කුමාරවරුන් සිහසුනේ තබා රජ කොට කිරුළු පැළඳ වීමටද භික්ෂූහු පුරෝගාමී වූහ.

මේ නිසා අනාදිමත් කාලයක සිටම රටේ පාලකයෝ මහා සංඝයා කෙරෙහි සහ පන්සල් වෙහෙර විහාර කෙරෙහිත් මහත් භක්තියක්, ගෞරවයක්, සැලකිල්ලක් දැක්වූහ. රාජ යුගයෙන් පසු ප්‍රජාතන්ත්‍රවාදී යැයි කියන ජන සම්මත යුගයකට අවතීර්ණ වූ පසුද පාලකයෝ ඒ ගෞරවය, භක්තිය අඩු නොකළහ. ඉංග්‍රීසි ආණ්ඩුව පවා අවසාන කාල පරාසයේදී භික්ෂූන්ට දැක්වූයේ ගරු ගාම්භීර සැළකිල්ලකි. හික්කඩුවේ සුමංගල හිමියන් ගරු තැන්හි තබන්නට පවා, ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයා ගෞරවනීය විය. 1948 නිදහසින් පසු මෙරට රාජ්‍ය බලය රාජ්‍ය මණ්ත්‍රණ සභාවටද, ඉන් පසු නියෝජිත මන්ත්‍රී මණ්ඩලයටද, අනතුරුව පාර්ලිමේන්තුවට ගිය පසු රටේ විධායකය වූ අගමැතිවරු මහා සංඝයා කෙරෙහිත්, වෙහෙර විහාර කෙරෙහිත්, ප්‍රධාන කොට දළඳා වහන්සේ කෙරෙහිත් අසාමාන්‍ය ගෞරවයක් දැක්වූහ. ඩී. ඇස්. සේනානායක, ඩඩ්ලි. සේනානායක, ශ්‍රීමත් ජෝන්


කොතලාවල, ඇස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක, සිරිමාවෝ බණ්ඩාරනායක, ජේ. ආර්. ජයවර්ධන, ආර්. ප්‍රේමදාස, ඩී. බී. විජේතුංග වැනි හිටපු රාජ්‍ය පාලකයින්ද, චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිණියද, ඒ ගෞරවය රැක දුන්න.

මැතිවරණ ලං වෙද්දී, වඩා හොඳ බෞද්ධයා කවරෙක්ද යන්න කුතුහල ජනක ලෙස වේදිකාව මත ප්‍රශ්නාර්ථයට බඳුන් වීම වැළැක්විය නොහැකිය. මෙයින් අප ජනතාව අදහස් කරන්නේ අපේ රටේ පාලනය වඩා හොඳ බෞද්ධයෙකුට භාරදිය යුතු බව නොවේද? එය තර්කයක් නොවන්නට පුළුවන.


අබෞද්ධ වඩුගයන් වූ ශ්‍රී විජය රාජසිංහ, කීර්ති ශ්‍රී රාජසිංහ සහ ශ්‍රී වික්‍රම රාජසිංහ පවා අප සිංහල බෞද්ධ ජනතාව තර්කයක් නැතිව රජවරුන් ලෙස පිළිගත්හ. ඒ ඔවුන් බෞද්ධාගම වැළඳ ගැනීමෙන් බෞද්ධ වූ නිසාය.

ඇස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතා උපතින් ක්‍රිස්තු භක්තිකයෙකු විය. අත්තනගලු රජමහා විහාරයේදී තෙරුවන් සරණ ගොස් එතුමා බෞද්ධයෙක් විය. ජේ. ආර්. ජයවර්ධන මහතාද එසේමය. එතුමා කැලණි රජ මහා විහාරයේදී එලෙසම බෞද්ධයෙක් විය.

බෞද්ධ කතාව අද වඩාත් කතා බහට ලක්වන්නේ ජනාධිපතිවරණයක් ළඟ ළඟම එන නිසාය. එම නිසා එය තර්ක ඥානයට හසුකොට වඩා හොඳ බෞද්ධයා කවුරුන්දැයි රටට හෙළි කිරීම කාලෝචිතය.



සැදැහැ සිතින් බුදු පුදම...



මව, බිරිඳ සමග පුදසුනක් ඉදිරියේ...

# කීර්තිමත් පවුල් ඉතිහාසයක පැටිකිරිය

අධිරාජයවාදී යුගයේදී පවා ඉංග්‍රීසීන් දණ ගැස්සූ කීර්තිමත් පවුල් ගණනාවක් ලංකාවේ තිබුණේය. බෝතලේ සේනානායක පරපුර, බොරළුගොඩ ගුණවර්ධන පරපුර ඉන් ප්‍රධානය.

ලංකා සිවිල් සේවයේ ප්‍රථම ඉඩම් කොමසාරිස් වරයා වූයේ, ලන්ඩන් විශ්ව විද්‍යාලයෙන් උපාධිය ලැබූ සිරිල් ලෙනාඩ් වික්‍රමසිංහ හෙවත් සී. එල් වික්‍රමසිංහ ශ්‍රීමතාණන්ය. පසුව ඒජන්ත පදවියට පත් හෙතෙම, ලංකාවේ ප්‍රථම සිංහල ඒජන්තවරයාද විය. සබරගමුවේ සහ උතුරු මැද පළාතේද ඒජන්තවරයා ලෙස කටයුතු කළ හෙතෙම කුරුණෑගල මූණමලේ වලව්වෙන් කරකාර බැන්දේය. ඇය ඒඩා මූණමලේ නම් විය. මූණමලේ වලව්ව සත් කෝරළයේ කීර්තිමත් වංසක්කාර උසස් බෞද්ධ පවුලකි. මෙම සී. එල් රාජ්‍ය මන්ත්‍රණ සභා පළමු මැතිවරණයේදී නිතරහයෙන් තේරී පත්ව පළමු ආණ්ඩුවේම කෘෂිකර්ම ඇමතිවරයා විය.

පළමු අගමැති ඩී. එස්. සේනානායක වර්තමාන කෘෂිකර්ම පුනරුදයෙහි නිර්මාතෘවරයා බව ඉතිහාසයෙන්

සැබවිය නොහැකිය. ඩී. එස්. ගේ කෘෂිකර්ම ප්‍රතිපත්තිය සාර්ථක කරගනු සඳහා සී. එල්. අත්වැලක් විය.

මුණමලේ වලව්වේ බෞද්ධ කාන්තාවක වූ ඒඩා හා සිරිල් ලෙනාඩ් විවාහයේ දැවැන්ත ප්‍රතිඵලය වූයේ පුතුන් තිදෙනෙකු සහ දියණියක ලැබීමය. මේ කුටුම්භය තුළ මහා දැවැන්ත වනස්පති රුකක් සේ නැගී සිටියේ වැඩිමල් පුත් එස්මන්ඩ්ය. එස්මන්ඩ් ශ්‍රී ලංකා දේශපාලනය උඩු යටිකුරු කළ, තීරයෙන් පිටුපස සිටි දැවැන්ත දැති රෝදය විය.

එස්මන්ඩ් පෙරළිකාරයෙක් විය. උගත් කමින්ද පරිපූර්ණය. කොළඹ රාජකීය විදුහලෙන් අත් පොත් තබා යුනිවර්සිටි කොලීජිය හරහා, ලන්ඩන් ඉන්ටර් විභාගයෙන් ඉතිහාසය පිළිබඳ ගරු තැන්හි සැලකෙන උපාධියක් ලබා ගත්තේය. යුනිවර්සිටි කොලීජියේ ශිෂ්‍ය සංගම් සභාපති වරයාද විය.

තාත්තා වූ සී. එල්, ඩී. එස් ගේ අගසව් වුවද, පුතා එස්මන්ඩ් මාක්ස්වාදී ව්‍යාපාරය හරහා රතු තොප්පියක් සහ රතු කමිසයක් හැඳ වාමාංශික නායකයින් සමඟ පෙළපාලි ගියේය.

මේ පිළිබඳ සටහනක් තබන රංජිත් අමරකීර්ති පලිහපිටියගේ සඳහන මෙසේය.

"ඩී. එස්. සේනානායකගේ සමීපතමයෙකු ලෙස, සී. එල්. ගොවි ජනපද ව්‍යාපාරයේ නියැලෙද්දී පුතාගේ දේශපාලන ස්ථාවරය ඊට ඉඳුරාම වෙනස් විය. ඩී. එස්. සමනල කන්ද

තරම් මුදල් වියදම් කොට, කුරුම්නියන් තරම් වූ මදුරුවන් බෝ කරන ගොවි ජනපද බිහි කරන්නේ යැයි කියන වාමාංශිකයන් ඇසුරෙහි එස්මන්ඩ්ගේ දිවි ගහ ගලා ගියේය."

(හේ රනිල් නම් විය - පිටුව 25)

තාත්තා තෙත් බිම් හරහා ඩී. එස්. සමඟ ද්වන්ධ යුද්ධයක යෙදෙද්දී, තරුණ එස්මන්ඩ්, කොල්වින්, කේනමන්, ඩොරික්ද සූසා, ටෙරන්ස් එන් ද සිල්වා, ඇස්. ඒ. වික්‍රමසිංහ, පිලිප් ගුණවර්ධන, ලෙස්ලි ගුණවර්ධන, බර්නාඩ් සොයිසා සමඟ පෙළපාලි ගියේය. මේ එස්මන්ඩ් පසුව එක්සත් ජාතික පක්ෂයේ නායකයින්ගේ පුරෝගාමියා බවට පත් වීම දෛවයේ සරදමකි.

එස්මන්ඩ් නීති විද්‍යාලය හරහා අධි නීතීඥයෙක් විය. එස්මන්ඩ්ගේ විවාහය පෙම් බැඳීමකි. ඇය නීති විද්‍යාලයේ සිටි නාලනී විජේවර්ධනය. නාලනී විජේවර්ධන කලකදී පුවත්පත් ලෝකයේ ජය කෙහෙළි නැංවූ ඩී. ආර්. විජේවර්ධනගේ වැඩිමහල් දියණියයි.

මේ ඩී. ආර්. විජේවර්ධන විවාහ වූයේද කුරුණෑගල මූණමලේ වලව්වෙන්ය. විජේවර්ධන පවුලද ගෞරවනීය සහගත බෞද්ධ පවුලකි. විජේවර්ධන පරපුර ශ්‍රී ලංකාවට ඉතා සුවිශේෂය. කළුතර දිස්ත්‍රික්කයේ තුඩුගල පරපුර සීතාවක රජකළ දෙවන රාජසිංහ නරපතියන්ට නෑදෑයින්ය. ඒ අනුව විජේවර්ධන පරපුර රාජකීය පරපුරකි. 1856 දී ඌවේ දිසාව වී, රණකාමය පැතිරූ තුඩුගල මද්දුමරාළ සහ ඔහුගේ සොහොයුරු තෙන්නකෝන් රාළ මේ පරපුරේ මුත්තන්ය.

දොන් පිල්ප් තුඩුගල විජේවර්ධන මේ වීරවරයින්ගේ පරපුරේ මෑත, දැවැන්තයින් බිහිකල පියාණන්ය. ඔහු කැලණිය සේදවත්තේ මහ ගෙදර කර ගනිමින් වෙළඳ ව්‍යාපාර වලට අත යෙදීය.

කැලණි විහාරයේ නව පුනරුදයේ නිර්මාතෘවරිය වූ හෙලේනා විජේවර්ධන, ඩී. ආර්. විජේවර්ධනගේ අම්මාය. ඇය ලංකාවට කීර්තියක් ගෙන දුන් මහා බෞද්ධ උපාසිකාවකි. වචනයේ අර්ථයෙන්ම විශාකාවකි. (ඒ පිළිබඳ විස්තරය පසුව සටහන් වෙයි.) ඩී. ආර්.ට ඇඹේනිය වූයේද මූණමලේ වලව්වේ ළමා තැනියක බව පෙර සඳහන් කළෙමු. ඩී. ආර්. ගේ දෙවු දියණිය නාලනී, එස්මන්ඩ් වික්‍රමසිංහගේ පාදපරිවාරිකාව වූ බවද පෙර සඳහන් කළෙමු. දොන් පිලිප්ට ලෙන්ගතු බිරිඳ වූයේ හෙලේනා විජේවර්ධනයි. ඇය දානපති බෞද්ධ උපාසිකාවයි. පසු කලෙක රටේ ව්‍යවස්ථාවට නව ජීවයක් දුන් ජේ. ආර්. ජයවර්ධනගේ පියා වූ ඊ. ඩබ්ලිව්. ජයවර්ධන විවාහ වූයේ මේ දොන් පිලිප් සහ හෙලෙනාගේ දෙවු දියණිය ඇග්නස් සමහය. ලේක්හවුස් නම් දැවැන්ත මාධ්‍ය ව්‍යාපාරයේ පුරෝගාමියා වූ ඩී. ආර්. විජේවර්ධන මේ යුවලගේම පුත්‍රයෙකි.

නාලනී එස්මන්ඩ් විවාහය මේ රටේ දේශපාලන පොරපිටියට සිංහයෙකු බිහි කරන්නට සමත්විය. ඔවුන් දෙපොලට පුතුන් හතරදෙනෙක් සහ දියණියක් ද වූහ. ශාන්, රනිල්, ශානිකා, නිරාජ් සහ චන්න යනු මේ සිව් දරුවන්ය. මේ කුඩා කෘතියට පාදක වූ ප්‍රධාන චරිතය, මේ සිව් දෙනා අතරින් රනිල්ය. ඔහු රනිල් වික්‍රමසිංහ නමින් අද දේශපාලන රණබිමේ ප්‍රධාන සටන්කරුවාය. විපක්ෂ නායකවරයාය. ජනාධිපති අපේක්ෂකයාය.

# එස්මන්ඩ් වික්‍රමසිංහ ගැන කෙටි සටහනක්

එස්මන්ඩ් වික්‍රමසිංහගේ බාල සොහොයුරා වූයේ ලක්ෂ්මන් වික්‍රමසිංහය. ඔහු ලංකා සභා ක්‍රිස්තියානි නිකායේ කුරුණෑගල පළමු වන ශ්‍රී ලාංකික බිෂොප්වරයා විය. එහෙත් එස්මන්ඩ් තුළ පල්ලිය සමඟ ආගමික බැඳීමක් නොවීය. එය ඔහු වාමාංශික නැඹුරුවෙන් ලත් ප්‍රගුණතාවයකි. ඔහු නාමික කිතුණුවෙකු විය. නාලනී විජේවර්ධන නම්, මේ රටේ මෑත යුගයේ පහලවූ අතිශ්‍රේෂ්ඨ බෞද්ධ කුලපතිනිය සමඟ විවාහ වීමෙන් පසු ඔහුගේ නැඹුරුව පන්සලටම යොමු විය. සිය මාමා විසින් ආරම්භ කරනු ලැබූ ලේක්හවුස් ආයතනයේ පළවූ "දිනමිණ" සහ "සිළුමිණ" යන පුවත්පත් වලින් එස්මන්ඩ් මේ රටේ බෞද්ධ උරුමය සඳහා දොරටු විවර කළේය. බෞද්ධ දර්ශනය පදනම් වූ ජාතික සංස්කෘතිය විවර කිරීමට සිය කතුවරුන් මෙහෙය වීය. පියසේන නිස්සංක, මාර්ටින් වික්‍රමසිංහ, මීමන ප්‍රේමතිලක, හික්කඩුවේ ලියනගේ, විමලසිරි පෙරේරා වැනි ජාතිමාමක බෞද්ධ කතුවරුන් ලවා බෞද්ධාගමේ දියුණුවට අති ප්‍රෞඪ කතු වැකි ලියවුවේය. එපමණකුදු නොව අදත් බෞද්ධ මාධ්‍ය විෂයෙහි සුවිශාල පත්‍රයක් වූ "බුදුසරණ" ද දිනමිණ වෙසක් කලාපයද ආරම්භ

කළේය. පැලැනේ සිරි වජිරඥාන, නාරද, මඩිහේ පඤ්ඤාසීහ, බද්දේගම විමලවංශ, හාන්දුපැල්පොල පුඤ්ඤසාර, හීනටියන ධම්මාලෝක, වැනි උගත් පඬි යතිවරුන්ගේ ලිපි ලේඛන වලට දිනමිණ, සිළුමිණ පුවත්පත් වල මුල් තැන දීමට කතුවරුන්ට නියෝග කළේය. කැළණියට සහ අටමස්ථානයට විශේෂ අතිරේක පළකරන්නට උපදෙස් දුන්නේය.

ලංකාවේ විශ්ව විද්‍යාලයක් පිහිටුවිය යුත්තේ ශාස්ත්‍ර ගවේෂණයට මිස අධ්‍යාපනයට නොවේ යැයි විශ්ව විද්‍යාල පිඹුරුපත් සැකසූ අයිවර් ජෙනිංස්ට කීවේය. මේ අනුව අනුරාධපුර පොළොන්නරුව, කැටයම් ලතාව සංකලනය කොට පේරාදෙණිය විශ්ව විද්‍යාලය පිහිටුවීමට පුරෝගාමීයාද විය.

ඕල්කට්තුමාගේ අවතීර්ණයත් සමග ඇරැඹි බෞද්ධ දහම් පාසල් ව්‍යාපාරයට ප්‍රචාරය ලබා දුන්නේය.

ජන සංගීතයට සහ සිතුවම් කලාවට ස්වකීය පුවත්පත් වලින් ප්‍රසිද්ධිය ලබා දුන්නේය. පණිභාරත, ඇල්බට් පෙරේරා (අමරදේව), තිත්තවෙල ගුණයා, සෝමබන්දු, මංජු ශ්‍රී වැනි ජාතික දායාද ඉස්මතු කළේය.

ඒ අතින් බලන විට එස්මන්ඩ් බෞද්ධ පුනරුදයේ සහ සාහිත්‍ය කලා පුනරුදයේ දැවැන්ත ලෙස පසුබිමේ සිටි ජාති හිතෛෂියාය. ඩී. ආර්. විජේවර්ධන නම් ලේක්හවුස් ආයතනයේ නිර්මාතෘ වර මාමණ්ඩියටත් එහා යමින් එස්මන්ඩ් ජාතික පුනරුදයේ ගැල් සාත්තු නායකයා බවට පත් විය. අධිරාජ්‍යවාදී පරගැති චින්තනය සුණු විසුණු කරන්නට එස්මන්ඩ්ගෙන් සිදුවූ මෙහෙවර අති විශාලය.

එස්මන්ඩ් වික්‍රමසිංහ මහතා දැවැන්ත පුවත්පත් ව්‍යාපාරයක හිමි කරුවූවා සේම පුවත්පත් කලාවේදීයෙකු විය. ඔහු තිස්වන වියේදී, සිරිල් එස්මන්ඩ් ලූෂන් වික්‍රමසිංහ නම් වූ මේ මහා පත්තර කාරයා ලේක්හවුස් ආයතනයේ (සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ) කර්තෘ මණ්ඩල කළමනාකාර අධ්‍යක්ෂවරයා විය. විය. ඒ 1950 දීය. 1964 සිරිමා බණ්ඩාරනායක රජය යටතේ ලේක්හවුස් ජනසතු කරන බවට විවෘතව කතා කළේය. සිරිමා බණ්ඩාරනායක රජය පරාජය වීමටද එයම හේතුවක් විය. ඔහු පුවත්පත් නිදහස ඉතා අගය කළ කෙනෙකි.

පුවත් පත් නිදහස අගයනු සඳහා එස්මන්ඩ් වික්‍රමසිංහ දැක්වූ දායකත්වය වෙනුවෙන් ඔහු "රත්තරන් පෑන" (Goldan Pen) නම් සුවිශේෂ ජාත්‍යන්තර සම්මානයෙන් පිදුම් ලැබීය. ලෝකයේ පිළිගත් පුවත්පත් ආයතන හිමිකරුවන් 50 දෙනෙකුටද මේ සම්මානය හිමිවිනි.

# කවුද මේ රනිල් ?

නාලනී, එස්මන්ඩ් යුවලට 1949 මාර්තු මස 24 වනදා මීන ලග්නයෙන් උපන් දෙවන පුතුනුවන්, අනාගත ශ්‍රී ලංකා දේශපාලනයේ මහාමේරුව බවට පත්වෙතැයි ඔවුන් සිතන්නට නැත. එසේ සිතන්නට තරම් මීන ලග්න හිමිකරු පෙරහුරු දක්වූයේද නැත.

මීන ලග්නය ලෝකයේ දේශපාලන නායකයින් ගණනාවකටම උප්පත්ති ග්‍රහයා විය. භාරතයේ මහත්මා ගාන්ධි, ශ්‍රී නේරු පමණක් නොව කාල්මාක්ස් ද මීන ලග්නයේය. කෙසේ වුවද එස්මන්ඩ් නාලනී යුවලගේ මීන ලග්නයේ පුත්‍රයා කොළඹ රාජකීය විද්‍යාලයෙන් අධ්‍යාපනයට පා තැබීය. රනිල්ගේ උසස් අධ්‍යාපනය ගැන පසුවට තබමින් ඔහුට බෞද්ධ පරිසරය බල පෑ සැටි සලකා බලමු.

PRESIDENTIAL SECRETARIAT
LIBRARY



ජේ. ආර්. ජයවර්ධන සහ හෙලේනා ජයවර්ධන යුවල



එස්මන්ඩ් වික්‍රමසිංහ සහ නාලනී වික්‍රමසිංහ යුවල

PRESIDENTIAL SECRETARIAT
LIBRARY

# නාලනී විජේවර්ධන, අම්මාගෙන් ලද බෞද්ධ අධ්‍යාපනය

රතිල්ගේ අම්මා කීර්තිමත් කුල කාන්තාවක වූ නාලනී විජේවර්ධනයි. නාලනී බෞද්ධ කම, බෞද්ධ හැදියාව, සංවරය සහ විනය ලැබුවේ ඇගේ අම්මා වූ හෙලේනා විජේවර්ධනගෙන්ය.

පැහැයරණිය මිණි පැමිණිය කොත් අගට
බඳ කිකිණිය දද ගිගිණිය විමන් වට
නොව පැරණිය වන රමණිය විටින් විට
සැළලිහිණිය වදු කැලණිය පුරවරට

- (සැළලිහිණි සඳෙස 53 පද්‍යය)

තොටගමුවේ රහල් හිමියන්ගේ සැළලිහිණි සංදේශයේ සැළලිහිණියාට කැලණි පුද බිමට අවතීර්ණ වීමට මෙසේ උපදෙස් දුනි. ඒ කැලණි පුද බිම එසේ මෙසේ පුද බිමක්ද?

ගෞතම බුදුන් වහන්සේ තෙවැනි වරට ලංකාවට වැඩම කළේ මණිඅක්ඛිත නා රජුගේ ඇරයුමෙන්ය. මේ වැඩම කළ අවස්ථාවේදී සුමන සමන් දෙවිඳුන්ගේ ඇරයුමින්, සමනොළ ගිර මත සිරිපද සලකුණ පිහිට වූ බවද ශාසන

ඉතිහාසය කියයි. ඒ උතුම් පින්බිමෙහි අසිරිය රාහුල හිමියෝ මෙසේද වර්ණනා කරති.

දිය කඳ ගැඹර පිරි පුවතර මහ සයුර
මුව රද ලෙසින් වන අගතියි කර තඹර
මනනඳ කරන මිණි ගණමෙන් දිසි එවර
පැහැනද පහන් එහි මඟ වෙයි බල මිතුර

සත් මහල් ධාතු ප්‍රාසාදය, දේව විමානය, උත්තුංග දාගැබ, පෙති පිළිම, බුදු පිළිම වලින් ආඪ්‍ය වූ මේ කැලණි වෙහෙර බිම පරංගියා විසින් විනාශ කරනු ලැබීය. දාගැබ් හාරා නිධන් හොරා ගෙන, කැලණි පුර අසිරිය, පෘතුගීසින් විසින් සොහොන් බිමක් බවට පත් කරනු ලැබීය.

එයින් චිරාත් කාලයකට පසු කැලණි පුද බිම යළි පිළිසකර කොට එහි අසිරිය මතු කළේද මහා විශාකාවක වූ හෙලේනා විජේවර්ධන මැතිණියයි. ඇගේ සැමියාගේ අවසරයෙන් මහා ධනස්කන්ධයක් වියදම් කොට, සතර වාහල් යළිත් සකස් කළාය. එපමණකුදු නොව, අදත් ජගත් ඇගයීමට පත්වී ඇති කැලණි විහාර චිත්‍ර සම්ප්‍රදාය බිහි කළේද ඇයයි. සෝලියස් මෙන්දිස් නම් පරවේනිගත කලා ශිල්පියා ලවා ඇය කැලණි චිත්‍ර ආකෘතිය සකස් කළාය. විජේවර්ධන වරුන් හා කැලණි රජමහා විහාරය සදා ගසට පොත්තකි. විජේවර්ධන වරුන් අදත් කැලණි විහාරයේ ප්‍රධාන දායකත්වය උසුලන්නේද ඒ නිසාය.

මේ හෙලේනා සිටුවරිය හෙවත් අන්වර්ථ විශාකාවගේ දියණිය නාලනී, සොයුරන් කීප දෙනෙකු මැද හැදුණේ වැඩුනේ මවගේ ආභාසය මතය. පියා ව්‍යාපාර සඳහා තුන්

තිස් පැයම ගතකරද්දී අම්මා දූ දරුවන්ගේ ජීවන පැවැත්මට මුදුන් මල්කඩ වූවාය. ගෙදර තිබුණේ සම්පූර්ණ බෞද්ධ පරිසරයකි. උදේ හවස බුදුන් පුදන්නට දරුවන්ට උපදෙස් ලැබිණි.

හෙලේනා අම්මා නාලනී දියණිය කැටුව කැලණි විහාරයේ පිළිසකර කටයුතු බලන්නට ගියාය. සෝලියස් මැන්දිස් චිත්‍ර අඳින විට නාලනී දැරිය විමසුම් ඉරියව්වෙන් ඒ දෙස බලා සිටියාය. ළමා සාරිය හැඳගෙන කැලණි විහාරයට යන නාලනී, ඇගේ ගෙදර ඇති සුවිසුල් ජීවිතය අමතක කොට වෙහෙර අවට වළං තනන්නන්ගේ ජීවිතයටද එබී බැලුවාය.

අම්මාගෙන් ලද බෞද්ධ ඡානය, රතිල්ට පසු කලෙක ලැබින. එය දෛවයේ හාස්කමකි.

නාලනී විජේවර්ධන උගත් කාන්තාවක ලෙස තිසි වයස්හිදී එස්මන්ඩ් වික්‍රමසිංහ සමඟ විවාහ වීමෙන් පසු සුවිසල් පවුල් දෙකක ඊලඟ පුරුකක් තනන්නට පුරෝගාමී වූවාය.

නාලනී එස්මන්ඩ් යුවලගේ දෙවැනි පුතා හැටියට රතිල් ඉගෙන ගත්තේ අධිරාජ්‍ය ගැති පරිසරයක් පිළිබිඹු කළ, කළු සුද්දන් බිහි කරන මැෂිමක් වූ කොළඹ රෝයල් කොලීජියේය. රෝයල් කොලීජිය විනය සාරධර්ම සහ අධ්‍යාපනයට මුල් තැනක් දුන් විදුහලකි." උගනිව් නැත්නම් පිටවෙව්" යන අභියෝගාත්මක, එහෙත් සිසුනට කර්කශක පාඨය ද එහි තේමාව විය. ඒ වන විට අනගාරික ධර්මපාලතුමන්ගේ ජාතික සහ බෞද්ධ පුනරුදය දළු ලමින්

තිබුණේය. ආනන්ද, නාලන්ද, ධර්මරාජ යන විදුහල් වලින් ඉංග්‍රීසි අධ්‍යාපනය සමඟ බෞද්ධ පුනරුදය කුළු ගැන්වෙමින් තිබුණේය. පොල්වත්තේ බුද්ධ දත්ත, කලල් ඇල්ලේ ආනන්ද සාගර (කේයස්), බලංගොඩ ආනන්ද මෛත්‍රීය, ටිබෙට් ජාතික ඇස් මහින්ද වැනි ජාතිමාමක යතිවරුන් ආනන්දය හරහා ජාතික ප්‍රබෝධයක් ඇති කළහ. පී. ද ඇස්. ඇස් කුලරත්න, ගුණපාල මලලසේකර, එල්.එච් මෙත්තානන්ද වැනි විදුහල්පතිවරුන් ආනන්දය, නාලන්දය, ධර්මරාජය හරහා ජාතික ආගමික සටනට ගිණිමෙලවූහ.

මේ වන විට ශාන්ත තෝමස්, ට්‍රිනිටි වැනි විදුහල් වල අධිරාජ්‍ය ගැති අසිංහල අබෞද්ධ චින්තන රටාව දියත් වෙමින් තිබුණේය. එසේනම් රාජකීය (රෝයල්) විදුහලේ ඉගෙන ගත් රනිල්ට බෞද්ධ චින්තනය සහ බෞද්ධ හැදියාවන් ලැබුණේ කෙසේද? එය ලැබුණේ ගුරුන්ගෙන් සහ මවගෙන්ය.

එස්මන්ඩ් වික්‍රමසිංහගේ නිවස දේශපාලකයින්ට අති දැවැන්ත සාකච්ඡා මණ්ඩපයක් වුවද, ගෙදර දූ දරුවන් පාලනය නාලනී මවට හිමි විය. ඇය දරුවන් හැඩ ගැස්සුවේ ස්වාමි පුරුෂයාට වුවමනා ලෙස නොව තමාට වුවමනා ලෙසටය. නාලනී තම මවගෙන් ලද බෞද්ධ ආභාසය තම දරුවන්නටද දුන්නාය.

නාලනීගේ මව් හෙලේනා සිය දරුවන් උපන් විටම ඊ ගෙන ගියේ කැලණි රජ මහා විහාරයටය. බුදු පිළිම ඉදිරියේ ළදරුවන් බිම හොවා ඇය බෞද්ධ ආශිර්වාදය ලබා දුන්නාය. කැලණිය රකින විභීෂණ දෙවියන්ගේ ශාන්තිය ලබා දුන්නාය. (කුමක් හෝ හේතුවකින් හෝ අහේතුවකින්

එක් දරුවෙකු වූ ලක්ෂ්මන් වික්‍රමසිංහ බිෂොප්වරයෙකු වීම දෛවය විසින් විසඳිය යුත්තකි.)

නාලනී වික්‍රමසිංහ සිය මවගෙන් ලද ආභාසය පරිද්දෙන් රනිල්වද මුනි සිරිපද පහස ලත් කැලණි වෙහෙර තුළ උත්පත්තිය අභිෂේක කළාය. අම්මා උපන් ද ළදරියක ලෙස පිළිම වහන්සේ ඉදිරිපිට අත් පා නටවමින් වැතිර සිටියේ කොතැනද, රනිල් ළදරුවා ද එතැනම වැතිර අනාගත රාජ්‍ය නායකයා වීමට බුදු වරම් ලැබ ගත්තේය.

"නොව පැරණිය වන රමණිය විටින් විට" යැයි තොටගමුවේ මහා කාව්‍ය ඊශ්වරයාණන් කී ලෙස රනිල් නැමැති අත දරුවා කැලණි වෙහෙර තුළට ඇතුළු විය. එය අනාගත ලෝකයට අනාගත බෞද්ධ රාජ්‍යයට ඇතුළු වීමේ බිහි දොර හෙවත් වාහල් කඩ විය.

මේ කුඩා කිරිසප්පයා කැලණි වෙහෙර ඓතිහාසික පිළිම වහන්සේ ඉදිරිපිට පැදුරක හෙවූ අම්මා, භික්ෂූන් වහන්සේගේ ආශිර්වාදයෙන් හිසට පිරිත් පැන් හොවා, ආශිර්වාදය කළේ අනාගත අගමැතිවේය යන බලාපොරොත්තුවෙන් නොවේ. සාමාන්‍ය දරුවෙකුට කරන ආශිර්වාද ප්‍රාර්ථනයක් ලෙසය.

එහෙත් දෛවය එයට ඉඩ සැළසීද?

රණසිංහ ප්‍රේමදාස මහතා මේ රටේ විධායක ජනාධිපති වූයේද දේශපාලන රඟ මඩලේ "ගෝගියා පාෂා" වූයේද පවුල් පරිසරයකින් නොවේ. ඔහු නිර්ධන පන්තියෙන් බිහි වී, අධිරාජ්‍ය ගැති පසුබිම සූණු විසූණු කළේය. ඒ ඔහු සතු

දෘඪ අධිෂ්ඨානය සහ ඒකායන අරමුණු නිසාය.

රනිල්ට එවැනි අරමුණක් තිබුණේද? ඔහු දේශපාලනයට අවතීර්ණ වූයේ තම නෑයා වූ ජේ. ආර්. ජයවර්ධනගේ ඇරයුමෙන්ය. ප්‍රේමදාසට ඇරයුමක් තිබුණේ නැත. එහෙත් ප්‍රේමදාසට මෙන්ම රනිල්ටද උපන් තැනදීම ලත් පන්සලේ, වෙහෙරේ, ධාතු කරඬුවේ, පිරිත් නූලේ, සංඝයාගේ ආශිර්වාදය හිමි විය.

බුද්ධ බලය එයයි. ගෞතම බුද්ධ ආශිර්වාදයෙන් පෙරමඟ බලන්නේ කවුරුන්ද, හේ ජය ගන්නේය. එය රනිල්ටද සාධාරණ විය.

රාජකීය විදුහලේ උගන්නා කාලයේදීම රනිල් හුණුපිටියේ ගංගාරාමයටද නිතර ආ ගියේය. ඒ නාලනී අම්මා සමඟය. කවදත් එජාපයට පක්ෂවූ ගංගාරාමය, ඩඩ්ලි, සර් ජෝන්, ජේ. ආර්. වැන්නන්ගේ ජය භූමියද විය.

ඉඳ හිට බම්බලපිටියේ වජිරාරාමයට යමින් නාරද සහ පියදස්සී යන යතිවරුන්ගෙන් දහ උගත් එස්මන්ඩ් නාලනී යුවලගේ මද්දුම දරුවා තොදොල් බසින් අයන්න කියූ ගමන නැවැත්වූයේ නීති විද්‍යාලයෙන් පමණක් නොව ජගත් ප්‍රවීණ මහා රජවරුන්ගේ ප්‍රාසාද වලින්ය. ඔහු වජිරාමයේ දහම් පාසලට ගියේ දැඩි ආශාවෙනි.

"අයතු කී ආයන්න" කීමට පෙර වැලි මළුවේ සහ සල පතල මලුවේ වැලි නාගත්, පැටියා අම්මාගේ ඇකයට පැන්නාය. ලොකු හාමුදුරුවෝ කෙසෙල් ගෙඩියක් පැංචාට දෙමින් නැකැතට අකුරු කියූ අතර, එය අනාගතයේදී මහා සතර සාගරයකට හැරවිනි. අවශේෂ භික්ෂූන් කීප දෙනෙකු

සමගින් පිරිත් දෙසා පැංචාට ආශිර්වාද කරන්නට තරම් ලොකු හාමුදුරුවෝ කාරුණික වූහ. (වික්‍රමසිංහ පවුල සුවිශේෂ පවුලක් නිසා විශේෂත්වයක්ද විය)

"පුතා ලොකු උනාම කවුරු වෙනවද" ලොකු හාමුදුරුවෝ කුඩා රනිල්ගේ හිස අතගා ඇසුවේය.

"මම ලොකු උනාම ලොකු මිනිහෙක් වෙනවා." පැංචා කීවේය. සියල්ලෝම කොක්හඬලා සිනාසුණහ.

මේ ළපටි කතාව අනාවැකියක් සේ ඉෂ්ට විය. රනිල් පැංචා ලොකු වී ලොකු මිනිසෙක් වූයේය. රාජකීය විදුහල තුළ ප්‍රබල බෞද්ධ පරිසරයක් නොවීය. කතාව ඉංග්‍රීසියෙන්මය. (අදත් එසේදැයි නොදනිමු) බොරළුගොඩ සිංහයා වූ එමෙන්ම ප්‍රබල බෞද්ධ නායකයා වූ පිලිප් ගුණවර්ධනයන්ගේ පුත් රුවන දිනේෂ්ද රෝයල් නිෂ්පාදනයක් විය. 1956 දී ජන සම්මත යුගය ඇති කරන්නට බමුණු කුලය පෙරළූ ඇස් ඩබ්ලිව් ආර් ඩී බණ්ඩාරනායකගේ පුත් අනුරද රෝයල් නිෂ්පාදනයකි. එහෙත් මේ තිදෙනාම රෝයල් නිෂ්පාදනයෙන් බිහිවූ බෞද්ධ දරුවෝ වූහ.

රනිල් හෝඩියේ සිට විශ්ව විද්‍යාලයට යනතුරුම උගත්තේ රාජකීය විදුහලෙන්ය. උපාධි ලබා ගත්තේ ලංකාවේ විශ්වවිද්‍යාලයන්ගෙන්ය. අධිනීතිඥ විභාගය සමත් කළේ ලංකාවේ නීති විද්‍යාලයෙන්ය. දිනේෂ්, අනුර විදේශගතව උපාධි ලැබූ නමුත් රනිල් උපාධි ලබා ගැනීමට විදේශ ගත වූයේ නැත.

# රනිල් සංස්කෘතික කටයුතු වලට අත පොවයි

රනිල්ගේ මව නාලනී, ජාතික හා දේශීය චින්තනයේ පාදපරිචාරිකාව වූවාය. ඇයගේ මුදුන් මුල බෞද්ධ දර්ශනයයි. එය රනිල්ට හුරු පුරුදු කරන්නට ඇය සාඩම්බර ලෙස ඇප කැප වූවාය.

රනිල් හැදුනේ වැඩුනේ රන් හැන්දෙන් රන් කිරි කට ගෑ ගෙදරමය. ඔහුගේ අග සව්වන් වූ අනුර සහ දිනේෂ්ද එසේමය. දිනේෂ්ට නම් අධිරාජ්‍ය පාලකයින්ගේ භීතිය දනී තිබුණේ ඔහුගේ පියා පිලිප් ගුණවර්ධන යකඩ පරුවත සමඟ හැප්පුණු සිංහයෙකු නිසාය. අනුර මහ මුදලිතුමාගේ මුණුපුරාය. එවකට අගමැති පුතාය. මේ දෙයාකාර මිතුරන් දෙදෙනා අතර රනිල්ගේ ළමා ජීවිතය දෝලනය විය.

අනුරගේ බෞද්ධාගමික පසුබිම කෙසේ වෙතත්, මිතුරු දේශපාලන මතිමතාන්තර ඉවත දමමින් දිනේෂ් ගැනද යමක් කිව යුතුය. ඔහු රනිල් මෙන්ම මව්පිය පාර්ශවයෙන් ලද බෞද්ධ පන්නරයෙන් මුවහත් විය. (චරිතාපදානයන් ලිවීමේදී සත්‍ය වසන් කළ යුතු නොවේ.)



70-77 යුගයේ අරාජික වී ගිය දේශය
නිවහල් දැහැමි යුගයක් කරා මෙහෙයවූ
හිටපු ජනාධිපති
ජේ. ආර්. ජයවර්ධන මැතිතුමා

රනිල් පිළිබඳ මාතෘකාව තවත් ඉදිරියට ගෙන යන්නේ නම් වජිරාරාමයේ නාරද හිමියන් මෙන්ම සිංහල සංස්කෘතික ආයතනයද ඔහුට නිසි මග පෙන්වා දුන්බව කිව යුතුය. අම්මා නාලනී, කලාවට, සාහිත්‍යයට, චිත්‍රයට, නාට්‍යයට සංගීතයට ඇලුම් කළාය. තාත්තා එස්මන්ඩ් ලේක්හවුසියට තනි රකින්නට වූ නිසා බිරිඳට හා දරුවන්ට සම්පූර්ණ නිදහස දුන්නා මිසක ඒවාට හවුල් නොවීය.

ලයනල් වෙනට්ඩ් කලා නිකේතනය ඔවුනට කුරුදුවත්තේ කලා කෝෂ්ඨාගාරයක් විය. මහාචාර්ය සරත්චන්ද්‍ර මනමේ මංගල දක්ම පෙන්වූයේ ලයනල් වෙන්ඩ්ට් හිදීය. සිංහල නාට්‍ය බලා හුරුවක් නැති කුරුඳුවත්තේ ඇත්තියන් මනමේ බලා වශීකෘත වන විට එය රනිල් සමඟ නැරඹූ නාලනී අම්මා ගෙදර ගොස් උදන් ඇනුවාය.

"ඔන්න හරි හමන් සිංහල නාට්‍යයක් ඇවිල්ලා " ඇය තම සැමියා සමඟ කීවාය.

මව නාට්‍යය කළ මහාචාර්ය සරත්චන්ද්‍රයන්ව තිරයට පිටුපසින් ගොස් පෙන්නා. රනිල්වත් හඳුන්වා දුන්නාය.

අම්මා මනමේ බලා කොතෙක් උද්දාමයට පත්වීද රනිල්ද ඒ හා සමාන උද්දාමයකට පත්විය.

"ප්‍රේමයෙන් මන රංජිත වේ නන්දිත වේ" ඔහුගේ මනස මුමුනන්නට විය.

"පුෂ්පයෙන් වන සුන්දර වේ ලංකෘත වේ"
"ආලයෙන් වෙලී සැදීමේ ලතා"

අද බෞද්ධාලෝක මාවතේ, එදා බුලර්ස් පාරේ සුදර්ශි රංග පීඨය බිහි කිරීමට පුරෝගාමී වූවන්ගෙන් කෙනෙකි නාලනී වික්‍රමසිංහ, "බෙරහඬ" "මනමේ" "සිංහබාහු" "පබාවතී" වැනි සිංහල නාට්‍ය ක්ෂේත්‍රයේ අති ප්‍රබල නිර්මාණ බලන්නට රනිල් අම්මා සමඟ ගියේය. ශාන්ද ඉඳහිට මෙයට එක්විය. නාට්‍ය පුහුණුවීම් බලා ගෙදර එන රනිල් සහ ශාන් ඒ චරිත ගෙදරදී රඟ දැක්වූහ.

රනිල් මනමේ කුමරු විය. ශාන් වැදි රජු විය.

"මාගේ අවසර තොමගෙන<br>
මාගේ අවසර නොම ගෙන<br>
ආවද තා මාගේ විජිතෙටා" මේ ශාන්ය.<br>
"මාගේ තෙද බල නොම දැන<br>
මාගෙ තෙද බල නොම දැන ආවද<br>
මා සමඟ සටනටා"

එමෙන්ම ඔහු විනයධර, ධර්මධර, සුපේක්ෂලධර පඬිවරුන්ගේ සෙවන ලැබීය.

මනමේ නරිබෑනා, සිංහ බාහු, වෙස්සන්තර චෝර පබ්බත, වැනි උසස් පෙළේ නාට්‍ය පෙළ සංයුක්ත තැටි වලට නැඟීමේ පුරෝගාමී වූයේ නාලනීය. ඒ ඇය මුල්වී බිහිකළ 'සංගීතා' නම් කලා අසපුවෙන්ය. ඇය සිංහල සංස්කෘතික ආයතනයේ සභාපති වන විට එහි ලේකම්වරයා වූයේ දයානන්ද ගුණවර්ධන ශූරින්ය. මේ සියළු කලා කටයුතු වල ආභාසය රනිල්ටත් අවශේෂ සහෝදරයින්ටත් නිරතුරුවම ලැබින.

රනිල් ගල්කුරෙන් ගල්ලැල්ලේ හෝ වැලිපිල්ලේ අයනු කී අයනු ලීවේ නැත. රාජකීය විදුහලේ එවැනි ග්‍රාමීය ජන

අධ්‍යාපනයක් තිබුණේද නැත. හෝඩියේ සිට ඔහුගේ පන්තියේ එකට සිටි දිනේෂ්ට සහ අනුරටද එවැනි අධ්‍යාපන පසුබිමක් තිබුණේයැයි කිව නොහැකිය. ඔහු ගල්ලෑල්ල අතට ගත්තේ කැලණි වෙහෙර දහම් පාසලේදීය. වජිරාරාමයේදීය, ගංගාරාමයේදීය, එපමණක්ද නොව රනිල් රාජකීය විද්‍යාලයේ බෞද්ධ සංගමයේ සභාපතිද විය.

නාලනී අම්මා රනිල්ට අත්පොත් කරවන්නට රැ ගෙන ගියේ හුණුපිටියේ ගංගාරාමයටය. කැවුම්, අතිරස, මුංගුලි සහ කෙසෙල් සහිත පිරිකර රැගෙන ගියද අම්මා රනිල් අත ගල්ලෑල්ල සහ ගල් කූර තැබුවාය.

ගංගාරාමයේ නායක හාමුදුරුවන්ට අතුරුපස පිළිගන්වා, තම පුතා රටට වැඩ ඇති දරුවකු කරන සේ අත්පොත තබන්නැයි අම්මා නායක හිමියන්ගෙන් ඉල්ලා සිටියාය.

නායක හාමුදුරුවෝ බාලාංශයේ කුමාරෝදය දරුවා අත තබා, නැකැත් වේලාව නොවරදවා "අයන්න" කියවීය.

ඒ රනිල්ය. අම්මාත් තාත්තාත් මුව විදහා සිනහා නොවී මද සිනාවෙන් තම පුතුගේ සාහිත්‍ය රසය වැළඳුහ.

රනිල් අම්මා සමඟ නාට්‍යාගාරවලට ගොස්, සරච්චන්ද්‍ර, පනීභාරත, චිත්‍ර සේන ආදී කලා කෙත ඔප කළ දූවැන්තයින්ගේ සහජ කම් බලා අස්වාදයක් ලැබීය. අද සෝදාපාලුවට ගිය සුදර්ශිය එදා මහ කලා කරුවන්ගේ තිඹිරිගෙය විය.

බණ්ඩාරනායක, වෙල්වනායගම්, ඩඩ්ලි, ජේ ආර්, කොතලාවල, වැනි එදා දේශපාලන පොර පිටියේ දූවැන්තයින්

එස්මන්ඩ් තාත්තා සමඟ ආලින්දයේ රටේ අනාගතය සඳහා පිඹුරුපත් සකස් කරද්දී, ශාන්, රනිල්, ශානිකා, කුස්සියේ සිට අම්මා සමඟ සිංහබාහු රඟ දැක්වූහ. නිරාජ් සහ චන්න එවකට බඩ තෝරන්නන් වූහ. දේශපාලනයත්, කලාවත් සමාන්තරව ගලා ගිය නිවෙසක ඇත්තේ, මහාචාර්යය සුනිල් ආරියරත්න ලියා සෝමතිලක ජයමහා ගැයූ ගීතයක අරුත නොවේද? එය එස්මන්ඩ් වික්‍රමසිංහයන්ට මෙසේ ගායනා කළ හැකිව තිබුණේ යැයි සිතන්නට ඉඩක් නැද්ද "මගේ නිවන මගේ පැල්පතයි" පැල්පත වෙනස් කොට "මගේ නිවන මගේ සිටු ගෙයයි" යනුවෙන් එස්මන්ඩ් නොගයා සිටීද?

රනිල්, අම්මා සමඟ නාට්‍යාගාරවලට ගියා සේම තාත්තා සමඟ ලේක්හවුසියටද ගියේය. අද මෙන් එදා මුද්‍රණ තාක්ෂණය දියුණු වී නොතිබුණු යුගයක ඔහු අකුරු අමුණන බාස් ලඟට ගියේය. සුදු කමිසයේ මජන් තවරාගෙන. ඊලඟට එන්නේ කර්තෘ මණ්ඩලයටය. ලොක්කාගේ පුතා නිසා කර්තෘ මණ්ඩලය මේ කොලු පැංචාට ආදරයෙන් සැලකූහ.

මේ අතර සිටියෝ කවරහුද?

පියසේන නිස්සංක, මාර්ටින් වික්‍රමසිංහ, මීමන ප්‍රේමතිලක, ජී.බී. සේනානායක, එච්.එල්.ඩී. මහින්දපාල, ටාසි විට්ටච්චි, ඩෙන්සිල් පීරිස්, ටී.බී ඉලංගරත්න වැනි ලේක්හවුසියේ සිංහල ඉංග්‍රීසි පුවත්පත් පෝෂණය කළ මහා පඬිවරුන්ය.

සරසවිය පුවත්පතේ කතුවරයා වූයේ මීමන ප්‍රේමතිලකයි. ඔහුගෙන් පසු බොරලැස්ගමුවේ විමලසිරි පෙරේරාය. විමලසිරි

පෙරේරා සරසවිය චිත්‍රපට සම්මාන උළෙල පටන් ගත් පුරෝගාමියාය. රනිල්ට සිය තාත්තාගේ බල තල යටතේ චිත්‍රපට උළෙල නරඹන්නට අවසර පත්‍ර ගොන්නක්ම ගත හැකිව තිබුණි. එහෙත් ඔහු සරසවිය පත්‍රයේ කූපන් පුරවා මිතුරන් කීප දෙනෙකුට සහ තමාටද අවසර පත් තැපෑලෙන් ගෙන්වා ගත්තේය. එවකට ප්‍රවීණ නළු නිළියන් වූ ආනන්ද ජයරත්න, ඩොමී ජයවර්ධන, එච්.ඩී. කුලතුංග, ඩී ආර් නානායක්කාර, සේනාධීර කුරුප්පු, ගාමිණී පොන්සේකා, සන්ධ්‍යා කුමාරි, තලතා ගුණසේකර, උදුලා දාබරේ, ශාන්ති ලේකා, පුණ්‍යා හීන්දෙණිය, විජිත මල්ලිකා, කාන්ති ගුණතුංග, ජෝ අබේ වික්‍රම, දෙස ආසාවෙන් බලා සිටියේය.

අද විශ්‍රාම සුවයෙන් පසුවෙන, එස්මන්ඩ් වික්‍රමසිංහ යුගයේ ලේක්හවුසියේ පත්‍ර කලාවේදියෙකු සහ පසුව ලංකාදීප ප්‍රධාන කර්තෘව සිටි එල්මෝ ගුණරත්න පසු කලෙක සිය මතකය අවදි කරමින් කියා සිටියේ, රනිල්ගේ එදවස පැවැත්ම දුටු විට ඔහු රටේ කලාකරුවෙකු මිස දේශපාලකයෙකු වීමට කිසිම පෙර නිමිත්තක් නොතිබූ, බවය.

ලේක්හවුසිය තාත්තාගේ බල පරාක්‍රමය විහිදවූ ශ්‍රී ලංකාවේ පත්තර ක්ෂේත්‍රයේ මහගෙදර වූවා පමණක් නොව එය තුළින් නිපැදවූ මහා පත්තරකරුවන් ගොන්නද එසේ මෙසේ නොවේ. ඩී ආර් විජේවර්ධන සිය බෑනණුවන් වන එස්මන්ඩ් දිහා බැලුවේ තුන් කල් දක්නා නුවණින් යුතුවය. එස්මන්ඩ් ලේඛකයෙකු නොවූවත් අග්නිදිග ආසියාවේ සිටිය හොඳම පත්තර අයිතිකරු සහ පාලකයා විය.

ජේ. ආර්. ජයවර්ධනගේ කාලයේ සිටම ලේක්හවුසියේ පවතින උසස් ගුණාංග දෙකක් තිබේ. එකක් උදෑසන 9 ට ජාතික ගීය වාදනය වනවිට මුළු සේවක මඩුල්ලම ඒ ඒ හිටි තැන්වලම දෑත් ඉදිරියට එක් කොට බිම බලාගෙන ධ්‍යාන වේශයෙන් නිසලව සිටගෙන සිටීමය. අනික භෝජනාගාරයේ ඉතා අඩු මිලට සේවක මඩුල්ලට තුන්වේල සැපයීමය. (මේ උසස් ගුණාංග දෙක අද දක්වාම ලේක්හවුසිය තුළ ක්‍රියාත්මක වෙයි.) තාත්තා සමඟ ලේක්හවුසියට යන කුඩා රනිල් ද පළමු ක්‍රියාව එනම් ජාතික ගීයට ගරු කොට හිටි තැනම හිටගෙන සිටීමට පුරුදු විය.

ජේ. ආර්. ජාතික ගීයට, ජාතික කොඩියට ගරු කළා සේම එස්මන්ඩ් ද ගරු කළා සේම එදා කුඩා රනිල්ද ගරු කළේය.

මුලදී සඳහන් කළ නොහැකි වූ කරුණක් සඳහන් කිරීම මැනවැයි සිතමි. එස්මන්ඩ් වික්‍රමසිංහ නිවස පිහිටා තිබුණේ කොල්ලුපිටියේය. එය "ලක්මහල්" නම් විය. මේ සුවිසල් නිවස තුළ සෑම හවසකම සංගීතයෙන් උතුරායයි. රනිල්ගේ මව පියානෝව වාදනයට අති දක්ෂ වූවාය. ඇය වාදනය පටන් ගන්නේ "දන්නෝ බුදුන්ගේ" ගීයෙනි. රනිල්ද පියානෝව වාදනය පුරුදු වූයේ අම්මාගේ ඇසුරෙන්ය. ඔහු බොහෝ විට වාදනය කළේ 'සිරි බුද්ධගයා විහාරේ' ගීතයයි. කෙසේ වුවද එදා ලක්මහල් නිවසට ගොඩ වැදුනු කළු සුද්දන් බොහෝ දෙනෙකු අම්මා සහ පුතා වාදනය කරන මේ බොදු බැති ගී අනුවාදන වලින් වශීකෘත වූ බව නම් නිසැකමය. මේ ලක්මහල් නිවස රනිල්ගේ ආච්චි අම්මාගේ

සහ රනිල්ගේ පියාගේ මහගෙදරය. එම නිවසේ කෙළිදෙලෙන් ගත කලත් තරුණ වියට පැමිණෙන විට වික්‍රමසිංහ පවුල පදිංචිව සිටියේ, කොල්ලුපිටියේ පස්වන පටුමගේ දුවිසල් නිවසකය. අදත් රනිල්ගේ පෞද්ගලික නිවස එයයි.

එස්මි හෙවත් එස්මන්ඩ්ගේ මෑණියන් මේ ගෙදර දැවැන්ත චරිතයක් වූවාය. මහළු වියේ සිටි ඇය 'ලක්මහල්' නිවස පුරා බල පරාක්‍රමය විහිදුවාලූ විසල් තුගරුකක් බදුවිය. අනෙක් පුද්ගලයා එවකට පාර්ලිමේන්තුවේ මහලේකම් වූ සෑම් විජේසිංහය. සෑම් විජේසිංහ විවාහ වූයේ එස්මන්ඩ් වික්‍රමසිංහගේ නැගණිය සමගය. නෑකම අනුව සෑම් රනිල්ගේ මාමාය.

රනිල්ගේ මිත්තනිය වූ එස්මි කෑම මේසයේ මුලසුනේ සිටියදී පවුලේ කතාබහ හුදෙක් විවිධ විෂය තලයන් මත ගලා ගියේය. අන් සියල්ලන් දේශපාලනය ගැන කතා බහ කරද්දී රනිල්-ශාන්-ශානිකා සහ නාලනී අම්මා අතර කතාබහ වූයේ කලාව සහ සාහිත්‍යයයි.

ඒ ළමා අවදියේදී රනිල් හොඳ නැට්ටුවෙක් විය. ඔහු නැටුවේ ශ්‍රී ජයනාගේ ගුරු හරුකම් යටතේය. රනිල්ගේ පන්තියේ නැටුම් ඉගෙන ගත් තවත් හුරුබුහුටි ඉතා කෙට්ටු ළඳරියක වූවාය. ඇය චන්ද්‍රිකාය. රනිල් නැටුමට අදක්ෂ වූ හෙයින් එයින් ඉවත් විය. චන්ද්‍රිකාද යම් තරමක් දුරට නැටුම් හදාරා ඉවත් වූවාය.

මේ දෙදෙනාම අද දේශපාලන කරලියේ නම් නැටුම් නැටීම එක්තරා විදියක දෛවෝපගත සිද්ධියකි.

# රනිල් සහ භික්ෂූන් වහන්සේ අතර බැඳීම

රනිල්ගේ පියා වූ එස්මන්ඩ් සමග, පන්සල සහ භික්ෂුව එතරම් දුරට බැඳී තිබුනේ නැත. පන්සල සහ භික්ෂුව අතර දැඩි බැඳීමක් තිබුණේ ඔහුගේ බිරිඳ වූ නාලනීටය. එහෙත් 1964 වර්ෂය වන විට ලංකාවේ දේශපාලන ව්‍යුහය තරමක් කලබලකාරී වූයේන්, 'ලක්මහල්' නිවස තුළ පමණක් නොව පස්වන පටුමගේ නිවසේද භික්ෂූන් වහන්සේලා නිතර හැසිරෙන්නට වූහ.

1964 පැවැති සමගි පෙරමුණු රජය යටතේ පත්තර පනතක් ගෙනෙන්නට පිඹුරු පත් සැකැසෙන විට, එය අඩාල කිරීමේ මහා දැවැන්ත කාර්ය භාරය පිටුපස සිටියේ දේශපාලකයෙකු නොවන දේශපාලඥයෙකු වූ එස්මන්ඩ් වික්‍රමසිංහය. සිරිමා රජය හෙවත් සමගි පෙරමුණ රජය අවසන් ගමනට පා තැබුවේද මේ පත්තර පනතයි.

'ලක්මහල්' නිවස කලබලකාරී දේශපාලන කථාගාරයක් විය. ඩඩ්ලි., ජේ. ආර්. ප්‍රමුඛ කොට ගත් එක්සත් ජාතික පක්ෂ නායකයින්ද, ව්‍යාපාරකයින්ද, පත්තර කතුවරුන්ද



දළදාව අභියස - ලබයි ජනපති පදවි අනුහස



කොත විවර වෙනවා - දහම් සිතිවිලි දෝරෙ යනවා

එස්මන්ඩ්ගේ කතා මේසය වටා රොක්වූහ. ඒ අතර එදා රටේ පිළිගත් භික්ෂූන් වහන්සේලාද වූහ.

දූවමොට්ටාවේ අමරවංශ, හෙන්ඩියගල සීලරතන, බද්දේගම විමලවංශ, හීනටියන ධම්මාලෝක, මාලේවන ඥාණිස්සර, දෙවුන්දර වාචිස්සර, යන දන උගත් භික්ෂූන් වහන්සේලා පත්තර පනතට විරුද්ධව පෙළ ගැසුනහ. උන්වහන්සේලා නිතර 'ලක්මහල්' නිවසේ සහ පස්වන පටුමගේ නිවසේ සාකච්ඡා වලට සහභාගි වූහ.

රනිල් මේ කසාවත් දෙස දැඩි වූවමනාවෙන් බලා සිටියේය. අම්මා උන්වහන්සේලාට දානය පිළියෙල කළාය. රනිල්ද අම්මා පසුපස යමින් දානය බෙදුවේය.

කසාවත කෙරෙහි රනිල් තුල තරුණ වියෙහිදීම වූ මේ බැඳීම පසුකලෙක, ගංගාරාමයේ සහ කැළණි රජමහා විහාරයේ ප්‍රධාන දායකත්වය දක්වාම ගලා ගියේය. අදත් එසේමය.

ඔහුගේ දින චරියාව තුල බෞද්ධ වත් පිළිවෙත් අඩුවක් නොවීය. අම්මාගේ ආශිර්වාදය, උපදෙස් සහ දනමුතු කම් ඔහුගේ ගමන් මගට ආලෝකය විය.

# මාතා පිතු උපට්ඨානං

යෝ මාතරංවා පිතරංවා, මාතාපිතු උපටඨානං යන බුද්ධ භාෂිතය සැබෑ බෞද්ධයෙකු තුලම නිරන්තරයෙන්ම මුල් බැස ගත්තකි. රනිල් තුළ ද ඒ මහඟු ගුණාංග උපතින්ම සැදී පැහැදී තිබුනේය.

දෙමව්පියන්ට සළකන දරුවන් දෙවියෝ රකිති,යි යන්න පසක් කරමින් රනිල්ට හැම විටම දේවාරක්ෂාව ලැබුනේය. දේශපාලනයට අවතීර්ණ වූ පසුව ඔහුට දිවිමගේ පෙරමුණේ රාළ වූයේ අම්මාය. පියාගේ ගුරු හරුකම් ලැබීමට තරම් ඔහු වාසනාවන්ත නොවුවත් අම්මාගේ ආශිර්වාදය මත දේශපාලන ගමන ගියේය.

'අම්මත් එක්ක කතා කරල බලන්න ඕන.

යම් ගැඹුරු ප්‍රශ්නයකදී ඔහු අවසාන තීරණයට එන්නේ එසේය. අම්මා හරියට හරි දේ කිවාය. රනිල් අම්මා කී දේ හරියට කළේය. නාලනී අම්මා බලපෑවේ පවුලේ මද්දුමයාටය. ශාන්, ශානිකා, විරාජ් සහ චන්න දේශපාලන මග නොගිය හෙයින්, ඔවුන්ට අම්මාගේ උපදෙස් එතරම්ම අවශ්‍ය නොවීය.

සෑම සිංහල අවුරුද්දකදීම මේ දරුවන් දෙමව්පියන්ට බුලත් හුරුළු දී වදින පුරුද්දක් තිබුණේය. කොළඹ හතේ ධනපති පවුල් වල ඒ සිරිත තිබුණේ නම් ඉතා අල්ප

PRESIDENTIAL SECRETARIAT
LIBRARY

වශයෙනි. සිංහල අවුරුදු මේසයේදී අම්මාගේ අතින් කිරිබත් පිඩක් කා ඇයට වැඳ සතුටු, සාමිචියේ යෙදීම මේ දරුවන්ට හුරු පුරුදු වූ මහත්මා ගුණාංගයකි.

එස්මන්ඩ් හෝ නාලනී හෝ කවරදාකවත් දරුවන්ට සැර වැර වූවේ නැත. එසේ සැර වැර කිරීමට තරම් දරුවන් හිතුවක්කාර වූයේද නැත. කොටින්ම එස්මන්ඩ් යුවළ නිවසේ මෙහෙකාරියකටවත් සැර වැර වූවේ නැත. මේ පුරුද්ද රනිල් තුළ අද දක්වාම පවතී.

'ලක්මහල්' සුවිශාල සුවිශේෂ ගෘහයකි. රජුන් තැනූ කෝෂ්ඨාගාරයකි. එහි නිතර තර්ක විතර්ක හා සතුටු සාමීචි කථා පැවැතියේය. ගෙමිදුල පවුලේ ළමා ළපැටියන්ගේ කෙළි බිම විය. එහෙත් රණ්ඩු සරුවල් නොවීය.

රනිල් බාල කාලයේදිත් බොහෝ ඉවසිලිවන්තයෙකු වී යැයි නාලනී වික්‍රමසිංහ මැතිණිය කියයි. "හැදෙන ගහ දෙපෙත්තෙන් පෙනේ" යැයි කීවාක් මෙන් මේ තරුණයාගේ අනාගත නවාතැන් පොළ අම්මාට දිවැසින් මෙන් පෙනිණ. "පුතේ උඹ බුදු වේවායි" බෝසත් මැතිණියන් බෝසතුන්ට නියත විවරණ දුන්නාක් මෙන් නාලනී වික්‍රමසිංහ අවවාදයෙන් රනිල්ට නියත විවරණ දුන්නාය. ඔහු නීති විදුහලට ඇතුළු වන දා අම්මා දෙනෙතේ කඳුලු සඟවා ගෙන හිස අත ගා සිතින් ප්‍රාර්ථනා කළේ " මගේ පුතා ආණ්ඩුකාරයෙක් වේවා" යන්න විය හැකිය. එහෙත් නඩු කාරයෙකු වී මිනිසුන් හිරේ දමන්නටවත්, එල්ලුම් ගස් නියම කරන්නටවත් දෛවය රනිල්ට ඉඩ දුන්නේ නැත. ඔහු නීතිඥයෙකු වුවද උසාවියේ කතා කොට ඇත්තේ අවස්ථා කිහිපයකදී පමණය.

# කලාවට යෙදූ සිත

ලද විරාමයකදී ඔහු පියාගේ සුවිශේෂ පුස්තකාලයට ගියේය. ඩාන්ටේ, ෂේක්ස්පියර්, එච්.ජී වේල්ස්, බර්ටොල් බ්‍රෙස්ට්, ඉබ්සන් ආදී චරිත කියැවීය, සරත්චන්ද්‍ර, මාර්ටින් වික්‍රමසිංහ, ඩබ්ලිව්.ඒ. සිල්වා ආදීන්ගේ නවකතා හැදෑරීය. සුනිල් ශාන්ත, සී.ටී. ප්‍රනාන්දු, අමරදේව, ආනන්ද සමරකෝන්, ආදීන්ගේ ගී රස වින්දේය. මේ අම්මාගෙන් ලද ආභාසයයි. ගෙදර දාසි දස්සන් සිටි හෙයින් නාලනී වික්‍රමසිංහ මැතිණියට බොහෝ විවේක තිබිණි. ඇය ද මේ පොත් ගුල පරිහරණය කළාය. අම්මා තම දූ දරුවන්ට කියැවීම පුරුදු කළා පමණක් නොව උසස් ප්‍රබුද්ධ රස වින්දනයටද යොමු කළාය. හොඳ බටහිර ගීයක්, භාරතයේ මහා සම්ප්‍රදාය වූ රාගධාරී වාදනයක්, රස වීදීමට රනිල් අදත් විවේකය ප්‍රයෝජනයට ගනී. රාජ්‍ය නායකයෙකුට තිබිය යුතු නිරවුල් මනස හෙතෙම කුඩා කල සිටම සකසා ගත්තේය.

පුස්තකාලයේ ඉහළින් සමාධි පිළිමයක්ද, ක්‍රිස්තු රූපයක්ද විය. එයට පහළින් ලෝකය ජය ගත් රාජ්‍ය තාන්ත්‍රිකයන්ගේ පින්තූර විය. මහත්මා ගාන්ධි, ශ්‍රී නේරු, පතෙල්, සුභාෂ් චන්ද්‍රබෝස්, වැනි භාරත නායකයන්ගේද, තාගෝර්, විජයලක්ෂ්මි වැනි භාරත කලාකරුවන්ගේද, ඒබ්‍රහම් ලින්කන්, නැපෝලියන් වැනි ලෝක ප්‍රබලයන්ගේද ඡායාරූප

ඒ අතර විය. මේ මහා පුරුෂයින්ගේ නිහඬ ඉරියව් අතර සිට රනිල් අනාගතය සැලසුම් කළේය. පොත් සහ මහා පුරුෂයින්ගේ සේයාරූ අතර සිට ලෝකය විනිවිද දකින්නට ඔහුට හැකි විය. මේ නිසාම රනිල් වික්‍රමසිංහ තුන්කල් දක්නා පුද්ගලයෙක් විය.

බීතෝවන් හා මොසාට් ගේ සංගීත රස දහරින් ද, රවීන්ද්‍ර සංගීතයෙන්ද, උත්තර භාරතීය රාගධාරී සංගීතයෙන්ද මුස පත් වුණු රනිල් අමරදේවයන්ගේ මධුවන්ති ගී අතර මනස දෝලනය කළේය. ආනන්ද සමරකෝන් ගේ සහ සුනිල් ශාන්තයන්ගේ ගීයෙන් මත් වූයේය.

ඉසුඹු ලද හැම විටෙකම අම්මා සහ සොයුරු සොයුරියන් සමග උසස් නාට්‍ය බලන්නට ගියේය. ගම්පෙරළිය, විරාගය, යුගාන්තය වැනි මාර්ටින් වික්‍රමසිංහගේ පොත්ද. විජයබා කොල්ලය, දුනේත්‍රා වැනි ඩබ්ලිව්.ඒ. සිල්වාගේ පොත්ද, නිතර ඔහුගේ නිදි යහන මත විය. මේ හැම පොතකම ඉස්මතු වූයේ සිංහලකම සහ බෞද්ධකමය.

බෞද්ධ පොත පත කියවීමට රනිල් අදත් දක්වන්නේ මහත් රුචියකි. බලංගොඩ ආනන්ද මෛත්‍රී හිමියන්ගේ බුද්ධ චරිතයේ සිට ඉතා ගැඹුරු බෞද්ධ පොත් හෙතෙම නිතර කියැවීය. තුන් පිටකයේ තේරුම්ගත නොහෙන පොත් පවා සිතට වද දෙමින් කියැවීය. එයින් ලද දැනුම් සම්භාරය ඔහුගේ ගමන් මගට ආලෝකයක්ම විය.

බුදු දහම පිළිබඳ දැනුම සහ අවබෝධය ද ත්‍රිපිටකය, ධම්ම පදය ඇතුළු බෞද්ධ පොත් පත් කියවීමෙන් ලත් දැනුම ද ඔහු දේශපාලන කරලියේදී ප්‍රයෝජනයට ගත්තේය. බොහෝ අවස්ථාවල බෞද්ධ දර්ශනයෙන් උපමා උපමේය ගෙන හැර දැක්වීය.

# භික්ෂූන් වහන්සේලා රනිල්ව දකින හැටි

රනිල්ගේ ශ්‍රද්ධාව සහ ධාර්මික ඥාණය පිළිබඳව හුණුපිටියේ ගංගාරාමාධිපති ගලබොඩ ඥාණිස්සර පොඩි හාමුදුරුවෝ අප සමග මෙසේ කරුණු දක්වූහ.

"රනිල් හාමු කුඩා කාලයේ ඉඳලම බුද්ධාගමට, භික්ෂූන් වහන්සේට ලැදියි. ශ්‍රද්ධා සම්පන්නයි. අපේ ගංගාරාමය සමග සම්බන්ධකම් පැවැත්තුව අපේ ප්‍රධාන දායකයා රනිල්. ඔහු ධාතු කරඬුව හිස මතට ගන්න තරම් පින් කරල තියෙනව.

"පන්සිල් ගන්නෙ ඉතාම සංවරයෙන්, භක්තියෙන් එතුමාගේ ආගම් භක්තිය ගැන කිසිම අඩුවක් කියන්න බැ. රටට හිත ඇති අව්‍යාජ ජනතා පුත්‍රයෙක්...."

කැළණි රජමහා විහාරාධිපති ආචාර්ය කොල්ලුපිටියේ මහින්ද සංඝරක්ඛිත හිමියෝ මෙසේ අදහස් දක්වති.

"කැළණි රජමහා විහාරයේ වර්තමාන දියුණුව ඇතිවුයේ. හෙලේනා විජේවර්ධන ළමාතැනිගෙන්. මානෙල් වත්ත පූජා කළෙත් එතුමියගේ පරපුරයි. විජේවර්ධන පරපුරේ පුරුකක්

තමයි රනිල් වික්‍රමසිංහ කියන්නෙ. එතුමා කැළණි විහාරයේ ප්‍රධාන දායකයාය. එතුමා නිතර මෙහේ එනවා. අපෙන් උපදෙස් අවවාද ගන්නවා. අපට ගරු කරනවා. විහාරයේ පන්සලේ අඩුපාඩු සොයා බලනවා. එතුමා ඉතා හොඳ බෞද්ධ නායකයෙක්.

බෙල්ලන්විල රජමහා විහාරස්ථානයද රනිල්ට දහම් තෝතැන්නකි. හෙතෙම ඕනෑම කටයුත්තකට බෙල්ලන්විල මුල් කර ගනියි. බෙල්ලන්විල බෝධි පූජා තබන්නට නිතර උනන්දු වෙයි. අවංක බෞද්ධ යැයි කියාගන්නා රටේ ඇතැම් නායකයින්ට වඩා රනිල්ගේ බෞද්ධකම ගැන සැකයක් නැත. රනිල්ට බෙල්ලන්විල බෝ සමිදුන්ගේ ආශිර්වාදය ලැබෙන බවටද සැකයක් නැත.

උතුරු මැද දිසාවේ උප ප්‍රධාන සංඝනායක අනුරාධපුර ලංකාරාමාධිපති ශාස්ත්‍රපති රලපනාවේ ධම්මජෝති හිමියෝ, අනුරාපුර ශ්‍රී මහා බෝ සමිදුන් ඉදිරිපිටදී මෙසේ වදාළහ.

රට සංවර්ධනය කිරීම සඳහා එජාප නායකයින් එදා සිට දැඩි කැපවීමකින් ක්‍රියා කළා. එළඹෙන ජනාධිපති තරඟයට ඉදිරිපත්ව සිටින විපක්ෂනායක රනිල් වික්‍රමසිංහ මහතාද, ඒ අනුව යමින් රටේ ප්‍රශ්න හොඳින් අවබෝධ කරගත් ආදර්ශවත් නායකයෙක්.

ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ දෙවන රන් වැට නිර්මාණය කිරීමේදී රනිල් අගමැතිව සිටියදී රජයේ මුදල් වැය නොකර පෞද්ගලිකවම සංවිධානය වී ඒ කටයුතු වසරක් වැනි කෙටි කාලයකදී නිම කළේය. ඉදිරි අනාගතයේදී

විපක්ෂ නායක වරයාට එවැනි බෞද්ධාගමික සේවාවන් ඉටු කිරීමට අවස්ථාව උදාවේවා.

ශ්‍රී ලංකාවේ අප හැමදෙනාටම දේශපාලනයේ මූලිකාංග ඉගැන්වූයේ බුදුන් වහන්සේ. ධර්ම රාජ්‍ය සංකල්පය ඉගැන්වූයේ උන්වහන්සේ ධර්ම රාජ්‍ය ගොඩ නගන ආකාරය බුදු දහමේ අන්තර්ගත වෙනවා. කොසොල් රජතුමා ඇතුළු රජ දරුවන් බුදු දහමට අනුව ධර්ම රාජ්‍ය ගොඩ නගා ගත්තා. රජවරුන් හට රට පාලනය කළයුතු අයුරු ත්‍රිපිටකයේ චක්‍රවර්ති සීහනාද සූත්‍රයේ සඳහන් වෙනවා.

රට පාලනය කිරීමේදී රජදරුවන්ට දස රාජ ධර්මය අනුව කටයුතු කරන්න වෙනවා. එසේම සතර සංග්‍රහ වස්තූන් පරිත්‍යාග කරමින් රට පාලනය කළ හැකි අයුරු බුදු දහමේ සඳහන් වෙනවා. මේ අනුව කටයුතු කළොත් ධර්ම රාජ්‍යයක් ඉබේම ඇති වෙනවා.

ජාතියේ පියා බිහි කළ, බත් දුන් පියා බිහි කළ එ.ජා.ප.යේ වත්මන් උරුමය රනිල් වික්‍රමසිංහට පැවරී තිබෙනවා. ඔහු පක්ෂයේ පියවරුන්ගේ අඩි පාරේ යන වත්මන් පුරුකයි.

දස රාජ ධර්මයෙන් රාජ්‍ය පිහිටුවන්නට රනිල් වික්‍රමසිංහට හැකියාව ඇති බව ඒකාන්තය.

- (26.09.2005 ලංකාදීප)









# ඉතිහාසය පිළිබඳ දැනුම

නීතිවේදියෙකු වූ රනිල් වික්‍රමසිංහ ඉන් එහා ඉම පන්නමින් ජාතික ඉතිහාසයේ පිටු පෙරළන්නේ අත්දැකීම් සහිත ගවේෂකයෙකු ලෙසටය. ඔහුගේ ඉතිහාසය පිළිබඳ දැනුම අභියෝගාත්මකය, විවාදාත්මකය, තර්කානුකූලය.

පැරකුම්බා රජු විසින් පස්යොදුන් රට කුරුළු වැවූ බව ඔහු කියන විට උපහාස කළෝ, එහි ඇත්ත නැත්ත නොදත්හ. රටේ කොයි පළාතකට ගියද, ඒ පළාතේ ඓතිහාසික අගය හෙළිදරව් කිරීමේ දැනුමක් රනිල්ට තිබේ. එය විශ්මය ජනක දැනුමකි.

2005. සැප්තැම්බර් 23 වන දා අනුරාධපුර ශ්‍රී මහා බෝධීන් වහන්සේ අභියස පැවති අෂ්ටඵලරුහ බෝධීන්ගේ පහන් පූජා පින්කම අවස්ථාවේදී රනිල් විශ්මය ජනක ලෙස අනුරපුර ඉතිහාසය ගෙන හැර දැක්වූයේ මෙසේය.

"අනුරාධපුර නගරය පණ්ඩුකාභය රජතුමා ඇති කළ අගනුවරයි. එදා එතුමා ලංකාවම පළමු වතාවට එක්සේසත් කළේ මේ අගනුවර සිටයි. එලෙස ඇති වුණු රාජ්‍යයේ ඉතිහාසය අවුරුදු දෙදහස් පන්සීයක් වෙනවා. ඒ අනුව ආසියාවේ තිබෙන පැරණිම රාජ්‍යය ලෙස අනුරාධපුරය අපට සැළකිය හැකියි.

දේවානම් පියතිස්ස රජතුමාගේ ද අගනුවර අනුරාධපුරයයි. එතුමා මහා විහාරය ඉදිකොට මිහිඳු මහ රහතන් වහන්සේට පූජා කළා. සංඝමිත්තා මෙහෙණින් වහන්සේ වැඩමවා ශ්‍රී මහා බෝධිය රෝපණය කළා.

මෙය දුටුගැමුණු රජ සමයේද අගනුවරයි. එතුමා මහා සෑය හෙවත් රුවන්වැලි සෑය ඉදි කළා.

මෙය වසභ රජුගේද අගනුවරයි. එතුමා මේ අගනුවර සිට රජ රටට පළමුවෙන්ම මහා මාර්ග ක්‍රම ඇතිකළා එමෙන්ම ධාතුසේන රජතුමාගේ අගනුවරත් මෙකයි. එතුමා කලා වැව වැනි දැවැන්ත වාරි ක්‍රම ගොඩ නැගුවා.

මහසෙන් රජතුමාගේද අගනුවර මේ අනුරාධපුරයයි. එතුමාද මෙහි සිට විශාල වාරිමාර්ග ක්‍රම බිහි කළා. මානවම්ම රජතුමාත් මෙය අගනුවර කරගෙන ලංකාවත් මල්ලව රාජ්‍යයත් අතර සම්බන්ධතා ඇති කර ගත්තා. ප්‍රධාන තැන දුන්නේ වාරි කර්මාන්තයට. දෙවැනි සේන රජතුමාත් අනුරාධපුරය අගනුවර කරගෙන කලාපයේ බලය තහවුරු කළා. හතරවැනි මිහිඳු රජු මෙයම අගනුවර කරගෙන ඉන්දියාවේ ශ්‍රී විජය රජු සමඟ සම්බන්ධතා ඇති කරගෙන කටයුතු කළා.

මේ හැම දෙයකටම වඩා වැදගත් වන්නේ අපේ ඉතිහාසය කියන්නේ මේ අනුරාධපුරය බව තේරුම් ගැනීමයි. අපේ ශිෂ්ටාචාරයේ ආරම්භය අනුරාධපුරයයි."

අනුරාධපුර පින්බිමේ ජයසිරි මහා බෝ සමිඳුන් අභියස සිට අනුරපුර ඉතිහාසය කටපාඩමින් කිවූ මේ පුවත 2005.09.26 වනදා ලංකාදීප පුවත්පතේ පළ විය. එපමණක්ද නොවේ. ඒ මහා පින් බිමේ සිට මෙසේද ප්‍රතිඥා දුන්නේය.

# රනිල්ගේ ප්‍රතිඥාව

ඔහු මේ ප්‍රතිඥාව දුන්නේ දළඳා වහන්සේ, ශ්‍රී පාද පද්මය තරම්ම ලාංකීය බෞද්ධ ජනතාවට වැදගත් වන ශ්‍රී මහා බෝධි රාජයාණන් ඉදිරිපිටදීය. ඒ ප්‍රතිඥාව හුදී ජන පහන් සංවේගය සඳහා මෙසේ සටහන් කරමු.

"මේ පින් බිමේ සිට මා මෙසේ ප්‍රතිඥාවක් දෙනවා. යළි ශ්‍රී ලංකාව එක්සේසත් කරන බවට. "

(ශ්‍රී ලංකාව එක්සේසත් කළේ පළමුවන පැරකුම්බාවන්, විජයබාවත් සහ දුටුගැමුණු යන නරපතියන්ය. රනිල් දෙකඩ වූ රට යළි එක්සේසත් කරන බවට දෙන ප්‍රතිඥාවේ හරය සලකා බලමු)

"මේ එක්සේසත් කිරීම මා කරන්නේ සාකච්ඡා මාර්ගයෙන්, දනටමත් මා ඒ මාර්ගයෙන් බොහෝ දුර ගමන් කර තිබෙනවා. ආණ්ඩුවක් විදිහට යා හැකි දුර ගමන් කොට තිබෙනවා.

උතුරු නැගෙනහිර යුද ප්‍රශ්නය විසඳිය යුතු ආකාරය සම්බන්ධයෙන් ආණ්ඩුව සහ එල්.ටී.ටී.ඊ සංවිධානය අතරද, ප්‍රධාන පක්ෂ දෙක අතරද, ආණ්ඩුව සහ ජාත්‍යන්තර ප්‍රජාව අතරද. එකඟත්වයක් පවතිනවා. එමගින් රටේ භෞමික

අඛණ්ඩතාවය පවතින්නාවූ ද සෑම ජන කොටසකටම පිළිගත හැකි වන්නාවූ ද, සෑම ජනතාවකටම පිළිගත හැකි රාමුවක් ඇති වී තිබෙනවා.

ඉදිරි ගමන යා හැක්කේ රටේ ප්‍රධාන පක්ෂ දෙක එකතු වෙලා. මේ ප්‍රයත්නයේදී ආණ්ඩුවක් තනිව ගමන් කළ යුතු බොහෝ දුර ගොස් තිබෙනවා. එසේ නම් ප්‍රධාන පක්ෂ දෙක එක්ව එකඟතාවයකට පැමිණ එල්.ටී.ටී.ඊ.ය සමග සාකච්ඡා කොට ජාත්‍යන්තර සහයෝගයන්ද ලබා ගෙන විසඳිය යුතුය. එය අද තිබෙන එකම මාර්ගයයි.

(රනිල්, හැමවිටම මේ රටේ ප්‍රධාන ජාතික පක්ෂය වූ ශ්‍රී ලංකා නිදහස්පක්ෂයට රට ගොඩ නැගීම සඳහා සාකච්ඡාවට ආරාධනා කරයි. එය ප්‍රජාතන්ත්‍රවාදයේ උසස්ම ලක්ෂණයකි. ශ්‍රී ලං.නි.ප. මෙයින් පැන ගියද රනිල් යළි යළි එයම අවධාරණය කරයි.)

"එළඹෙන ජනාධිපතිවරණයේදී මා බලාපොරොත්තු වන්නේ සාකච්ඡා මාර්ගයෙන් ඇති කරගෙන තිබෙන රාමුව යළි ජනවරමක් ලබාගෙන අනුමත කර ගැනීමටයි. ඒ වරම මා මේ වතාවේ ලබාගත්තොත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සහ එල්.ටී.ටී.ඊ.ය සමඟ සාකච්ඡා කරනව.

මේ වන විට අප බොහෝ දුර ගමනක් ඇවිත් තිබෙනවා. ඉදිරියටත් අප ගමන් කළ යුත්තේ එකටයි. (ලංකාවේ කිසිම ජන නායකයෙකු මේ තරම් සංවේදී වූයේදැයි සිතා බලන්න.) ඒ සඳහා වරම් දිය යුත්තේ ජනතාවයි. එවැනි ජනවරමක් ලබා ගත් පසු දෙකඩවූ රට එක්සේසත් කරන බවට ජය ශ්‍රීමහා බෝ සමිඳු ඉදිරිපිට පොරොන්දු වෙනවා."

# උත්තුංගෙ පොරොන්දුවක්

රනිල් වික්‍රමසිහ "පොරොන්දු" දේශපාලනඥයෙකු නොවේ. ඔහු හඳෙන් හාල් ගෙනත් දෙන බවටවත්, සතියකට ධාන්‍ය රාත්තල් අටක් එක් අයෙකුට දෙන බවටවත් පොරොන්දු වූවෙක් නොවේ. චුයින්ගම්, බ්‍රේස්ලට් කතාවක් ඇදගෙන ඔහුට මඩ ගැසූ නමුදු, ඔහුගේ දේශන වල යථාතත්ත්වය සලකා බලද්දී රනිල් වික්‍රමසිංහ යනු සැබවින්ම අවංක, සංවේදී පුද්ගලයෙකි. ඔහුගේ මේ පොරොන්දුව පමණක් විමසා බලන්න. (23.09.2005 අනුරාධපුර ශ්‍රී මහා බෝ සමිඳු අභියසදී)

"එමෙන්ම මා මේ පුණ්‍ය භූමියේ සිට තවත් ප්‍රතිඥාවක් දෙනවා. පසුගිය වතාවේදී මා සිරිමා බෝ සමිඳුන්ට දෙවැනි රන් වැට නිර්මාණය කොට සකස් කර දුන්නා. මේ වතාවේ මා ප්‍රතිඥා දෙන්නේ මේ රටේ සංස්කෘතිය, ඉතිහාසය සහ උරුමය ගැබ්වුණු මහමෙව්නා උයන විශාල ව්‍යාපෘතියක් ලෙස සලකා මහමෙවුනා උයනට අදාල සියලුම සිද්ධස්ථාන දියුණු කොට අපේ උරුමය, ශිෂ්ටාචාරය මතු කරවන බවටයි. මෙහි මූලික කටයුතු ලෙසට මා තීරණය කර

තිබෙන්නේ වාහල්කඩ ඉදිකොට එහි වැඩ කටයුතු නිම කිරීමයි.

මහමෙව්නා උයන අපේ උරුමය පෙන්වන ජය භූමියයි. එම පින්බිම ආරක්ෂා කොට සංවර්ධනය කිරීමට ක්‍රියා කරන අතර, මහමෙව්නාවෙන් සහ පණ්ඩුකාභය රජ දහතින් මේ ශ්‍රී ලංකාව එක් සේසත් කරන බවට මා මේ ශ්‍රී මහ බෝ සමිඳු අභියස සිට ප්‍රතිඥා දෙනවා"

## ධර්මයෙහි හැසිරෙන්නා ධර්මය විසින්ම රකිනු ලබයි

මේ උත්තම බුද්ධ භාෂිතයයි. එය ලෝකෝත්තර දහමෙහි අන්දුටු සත්‍යයයි. අටලෝ දහම අනුව එය සදාතනික සත්‍යයයි.

දානය, ශීලය, පරිත්‍යාගය, ඍජු බව, මෘදු බව, තපස, මෛත්‍රිය, අවිහිංසාව, ඉවසීම, විරුද්ධ නැති බව දසරාජ ධර්මයේ කරුණු දහයවේ. නායකයෙකුට තිබිය යුතු මේ ගුණාංග රනිල් වික්‍රමසිංහට නොඅඩුව තිබේ. ඔහු දොළොස් වරක් පරාජය වී යැයි ඇතැමෙක් කියති. එහි ඇත්ත නැත්ත කෙසේ වුවද රනිල් තවමත් දෘඪ අධිෂ්ඨානයෙන් සිය අරමුණ කරා ගමන් කරන්නේය. ඔහුට පක්ෂයෙන් කැපිලි කෙටිලි නැත. කුමන්ත්‍රණ නැත. දොස් පරොස් නැත. කී වරක් පරාජය වූවත් පසුබාන චින්තනයක්ද නැත. එය ධර්මයේ හැසිරෙන්නා ධර්මය තුලින්ම රකින බව ප්‍රායෝගිකව පසක් කරන සිද්ධාන්තයකි.

# රනිල්ට පැරකුම් නිරිඳු ආදේශ කළ හැක්කේ ඇයි?

රනිල්ගේ සීයා සී. එල්. වික්‍රමසිංහ උතුරු මැද පළාතේ ඒජන්තවරයා වන විට කෘෂිකර්ම විප්ලවය හෙවත් හරිත පෙරළිය කළ ඩී.එස්. සේනානායක මහතා මෙරට අගමැති විය. ඩී.එස්. මහා පැරකුම්බාවන්ගේ මුහුණුවරම ලත් මහා කළු සිංහලයා විය. සේනානායක සමුද්‍රය නම් මහා වාරි සාගරයේ නිර්මාතෘවරයාද විය.

ඩී.එස්. උතුරු මැද වනගහනය කෙත්වතු බවට හරවන්නට පිඹුරු පත් සකසන විට සී.එල් උතුරුමැද ඒජන්තවරයා විය. සී.එල්. හරිත විප්ලවයට උපදෙස් ලබා ගත්තේ සී.එල් ගෙන්ය.

රනිල්ගේ සීයා හැටියට සී.එල්. මෙරට නව කෘෂිකර්ම පෙරළියට දායක වූයේ, පරිපාලන අත්දැකීම් ඇතිවය. ඒ නිසාම හෙතෙම ශ්‍රී ලංකාවේ ප්‍රථම ඉඩම් කොමසාරිස් වරයාද විය. ඉඩම් කොමසාරිස් යනු ඒජන්ත පදවියටත් වඩා ඉහළ තනතුරකි.

මෙනයින් බලන විට රනිල්ගේ සීයා මෙරට හරිත විප්ලවයේ පුරෝගාමියෙකි. රනිල් මෙවර ජනාධිපති බලය

ඉල්ලන්නේ, කෘෂිකර්ම විෂයය තුළින් ලංකාව පාරාදීසයක් කිරීමටය. ඔහුට එසේ කිරීමට හැකියාවද, වුවමනාවද, තිබේ.

මහා පරාක්‍රමබාහු නරපතියා අපේ කෘෂිකර්ම සාහිත්‍යයේ නිරවුල් කවියාය. එතුමා බිහිකළ පරාක්‍රම සමුද්‍රය අදත් සමුදුර සේ රළ පතර ගොඩ දමමින් පුලතිසි පුරය සරුසාර කරවයි.

පැරකුම් සමුදුර ඉදිරියේ සමුදුරු ආසිරි බලමින් අදත් මහ පැරකුම් පිළිරුව ධ්‍යාන ගතව වැජඹෙයි. ඒ පැරකුම් උරුමය රැකීමේ පූර්ණ අයිතිය රනිල් වික්‍රමසිංහට තිබේ.

ලංකාව අද කෘෂිකර්ම රටක් නොවුවත්, එදා රට රැකුණේ කෘෂිකර්මය නිසාය. මඩ සෝදාගත් කළ ගොවියා රජ කමට සුදුසු යැයි රොබට් නොක්ස් කීවා සේ ගොවියා ඔටුනු නොලත් රජෙකි. ඩී.ඇස්. සේනානායකගෙන් පසු ඒ බැව් වටහා ගත් එකම නායකයා රනිල් වික්‍රමසිංහය. අද වප් මඟුල් නොකළත්, ඔහු සැබැවින්ම රට සහලින් සරු කිරීමේ අදිටන ඇතිව සිටින්නෙකි.

ජනතා විමුක්ති පෙරමුණ ගෙන ගිය වැව් දහසේ ව්‍යාජ ඊතියා ව්‍යාපෘතිය රනිල්ගේ කෘෂිකර්ම වැඩපිළිවෙල හා සසඳන විට කදෝපැණියෙකි.

ඒ අතින් බලන විට රනිල් වර්තමාන පැරකුම්බාවන්යැයි කීම අතිශෝක්තියක් නොවේ.



කැලණි රජමහ වෙහෙර පුදබිම



බෙල්ලන්විල රජමහා විහාරය

# ප්‍රේමයෙන් මන රංජිතවේ නන්දිතවේ

රනිල් දේහ ලක්ෂණයෙන් අති සුන්දරය. ඔහු නීති විදුහලේ උගන්නා කාලයේදී තරුණියන් වශී කරන තරමේ රූප සම්පත්තියකින් හෙබියේය. තරුණියන් වශී කරන මේ සුන්දර තරුණයා, දෙස එක් සුන්දර යුවතියක් උනන්දුවෙන් බැලුවාය. එය මුහුකුරා යන තරමේ ප්‍රේම සම්බන්ධයක් බවට පත්විය.

ඇය මෛත්‍රී වික්‍රමසිංහය.

පසු කලෙක රනිල් මෛත්‍රීගේ අත ගත්තේ අම්මාගේ ආශීර්වාද මැද්දේය. ඇය කැළණි විශ්ව විද්‍යාලයේ ඉංග්‍රීසි පිළිබඳ කථිකාචාර්යවරියකි.

ඒ පෙම් කතාව පිවිතුරුය. එයටද පරිච්ඡේදයක් වෙන් කළ යුතුය.

මෛත්‍රී වික්‍රමසිංහ, රනිල් වික්‍රමසිංහගේ පතිනිය වූ නිසා වික්‍රමසිංහ වූවා නොවේ. ඇයගේ පෙළපත් නාමයද වික්‍රමසිංහය. ඇය නීති විද්‍යාලයේ උගන්නා කාලයේ පටන්ම රනිල් කෙරෙහි හිත් බැඳගෙන සිටියාය. එහෙත් ඒ ප්‍රේමය

ගස්යට, චිත්‍රපටශාලාවල, උයන් වතු වල ගලා ගිය එකක් නොවේ. හුදෙක් ඉතා සංවර, බුද්ධිමත්, විනයක් හා සදාචාරයක් අනුව ගොඩ නැගුනකි. අම්මාගේ ආශිර්වාදයද ඇතිව මේ විවාහය ඉතා වැදගත් ලෙස, සමාජීය හා නීති සම්මතය ලෙස සිදුවිය. ලේලිය හා නැන්දම්මා අතර ඇත්තේ දුහිතෘ මාතෘ බැඳීමකි. ඇය වචනයේ අරුතින්ම කුලවමියක වූවාය. පතිනියක, පාදපරිචාරිකාවක වූවාය.

එයට හේතුකාරණා කිපයක්ම තිබේ. රනිල් නීතිවේදයෙකි. නීතිය හැදූරූ මෛත්‍රී ඉංග්‍රීසි කථිකාචාර්යවරියකි. එහෙයින් දෙදෙනාම බුද්ධිමත්ය. බුද්ධිමත් යුවලකගේ සංයෝගය හොඳ පවුල් පදනමක මුල්ගල වැන්න.

දෙදෙනාගේම අදහස් සම වීම තවත් කාරණයකි. දෙපැත්තට ඇදෙන ගැටෙන අදහස් දෙදෙනා තුලම නැත. රාජ්‍ය නායකයෙකු වීමට පෙරහුරුවක යෙදෙන දේශපාලකයාට හොඳ පවුල් ජීවිතයක්ද තිබිය යුතුය. එසේ නොවුණු කළ එයද රටට මාතෘකාවකි. රනිල් මෛත්‍රී යුග පරාදීයය එතැනින් සමාප්ත කරමු.

# පරිසමාප්ත දේශපාලන දර්ශනය

රනිල් වික්‍රමසිංහට පැහැදිලි ලෙසට දේශපාලන දර්ශනයක් තිබේ. එය බොහෝදුරට ජේ.ආර්. ජයවර්ධනගෙන් ලැබූ ආභාසයක් විය යුතුය. කියන දේ කරන, කරන දේ කියන නායකයෙකු ලෙස රණසිංහ ප්‍රේමදාස වඩාත් කැපී පෙනුනේය. එහෙත් රනිල් ප්‍රේමදාස කෙනෙකු නොවේ. ඔහු ඇහුම්කන් දීමට කැමැත්තෙකි.

පක්ෂයේ සෙසු අයගේද අදහස් විමසා බලන්නෙකි. තනි ඒකාධිපති ප්‍රතිපත්තියක් ඔහු තුළ නැත. ප්‍රබුද්ධ දේශපාලන නායකයෙකුගේ ගති ලකුණු එසේය.

ජගත් ප්‍රජාව ඉදිරියේ ද ඔහු ප්‍රබල ජාත්‍යන්තර වාදියෙකි. ගිරාදුරු කෝට්ටේට ගිය විට අමු සිංහල ගැමියෙකි. කොළඹ කුරුඳුවත්තේදී ඉංග්‍රීසිකාර මහත්මයෙකි. සමාජයේ කවර තලයක වුවද හැසිරෙන, කථාකරන රටාවක් ඔහුට තිබේ. ඒ නිසාම ඔහු රටේ වඩාත්ම ජනප්‍රිය නායකයා ලෙස අද ඉදිරියෙන්ම සිටී.

ආර්ථික විප්ලවයක් යනු ඔහුගේ ඉලක්කයක්ය. කඩා වැටෙන ආර්ථිකයකට ඔහු අත ගසන්නේ නැත. දිරවාගත නොහැකි, බරපතල වචන ඔහුගේ ආර්ථික ශබ්ද කෝෂයේ

නැත. දේශපාලඥයෙකුට තිබිය යුත්තේ න්‍යායධර්මයන්ට වඩා ප්‍රතිපත්තීන්ය. න්‍යාය ප්‍රායෝගික කරන්නට යෑමේදී නොයෙකුත් පරිපාලන නීති හරහට සිටියි. වක්‍රලේඛ, අණපනත් හරස්වෙයි. ප්‍රතිපත්ති ප්‍රායෝගික කිරීමේදී ඒ සියළු බැඳීම් කඩා බිඳ දැමිය හැකිය. රනිල් ඒ සම්‍යක් ප්‍රයෝගය හඳුනා ගත්තෙකි.

"මා බලාපොරොත්තු වන්නේ දකුණු ආසියාවම අවසානයේදී නිදහස් වෙළඳ කලාපයක් බවට පත් වනු දැකිමයි. එමෙන්ම, ඉන්දියාවේ දකුණු ප්‍රදේශයද, ශ්‍රී ලංකාවද වඩාත් එකමුතුව වඩාත් ලඟින් කටයුතු කරනු දැකිමට මම කැමැත්තෙමි"

මේ කොතරම් ජාත්‍යන්තර වාදී ප්‍රකාශයක්දැයි විමසා බැලීම වටිනේය.

"ඉන්දියාව තම දේශීය කර්මාන්ත ආරක්ෂා කර ගනිමින්ම වෙළදාම නිදහසේ කරමින් සිටියි. එහෙත් ශ්‍රී ලංකාව එබඳු ක්‍රියාමාර්ගයක් අනුගමනය නොකරයි. නොසැලකිලිමත් ලෙස තිරු ගාස්තු අඩු කිරීම නිසා අපගේ කෘෂිකර්ම අංශයේ මෙන්ම කාර්මික අංශයේද මහත් විනාශයක් ඇතිවී තිබේ. ඉන්දියාව සමග අපේ ආර්ථික සහයෝගිතාව වර්ධනය කරගත යුතු අතර සාර්ක් කලාපයේ අනිකුත් රටවල් සමගද වඩා වැඩි සබඳකම් ඇතිකර ගත යුතුය. ආර්ථික වශයෙන් ඒකාබද්ධතාවයක් ගොඩනගා ගන්නා අතරම, අපගේ දේශීය යහපත කෙරෙහිද අවධානය යොමු කළ යුතුය..."

ඒ ඔහුගේ තවත් අදහසකි. පක්ෂයේ විනය පිළිබඳ පක්ෂ නායකයා හැටියට රනිල් වඩාත් අවධානය යොමු

කරයි. මුලින්ම තමා තුළ, ඉන්පසු පක්ෂයතුළ, විනය රැකගනියි. රටේ නායකයා හැටියට රටට විනය ගැන කියා දෙන්නට හැකියාව තිබේ. "ඔවා දෙනු පරහට තමා සම්මතේ පිහිටා සිට" යන්න ඔහුගේ ප්‍රතිපදාවය. පක්ෂ විනය ගැන ඔහු දක්වන අදහස් මෙසේය.

"විනය සංග්‍රහයකට අනුව එහි සාමාජිකයින් ක්‍රියා කරනු වස්, තම පක්ෂය ඇතුලතින්ම පිරිසිදු කිරීමට පියවර ගත් එකම පක්ෂය එක්සත් ජාතික පක්ෂයයි. අප පරීක්ෂණ පවත්වා වැරදි කරන ලද සාමාජිකයින්ට විරුද්ධව විනයානුකූලව පියවර ගෙන ඇති අතර, සමහර සාමාජිකයන්ගේ පක්ෂ සාමාජිකත්වය අත් හිටුවා ඇත. ශ්‍රී ලංකාවේ අන් කිසිම දේශපාලන පක්ෂයක් එසේ කොට නැත. දැනට සාමාජිකයින් කිහිප දෙනෙකුගේ සාමාජිකත්වය අත්හිටුවා ඇති අතර, ඉන් සමහරෙකු අධිකරණය ඉදිරියට ගොස් ඇත....."

චෝදනාවල් වලට ලක් වූ සුනාමි පුද්ගලයින්ගේ තාන්න මාන්න නොතකා ඔවුන්ගේ පක්ෂ සමාජිකත්ව කෙලින්ම අත්හිටවුයේය. ඔවුන් පක්ෂය කෙරෙහි ඇප කැපවුණු, වියහියදම් කළ අයවලුන් විය හැකිය. රනිල්ට ඒවා අවශ්‍ය නැත. යාළු මිතුරුකම්, හිතවත් කම්, ලැදිකම්, කැපවීම් නොබලා ඔහු පක්ෂය තුළ ගෞරවය රැකගැනීමට දැඩි ස්ථාවරයක සිටියි.

"මෙතෙක් එක්සත් ජාතික පක්ෂය විසින් පවත්වාගෙන පැමිණි උසස් විනය ගරුක තත්ත්වය දිගටම පවත්වාගෙන යාමට මම කැපවී සිටිමි. එම නිසා පක්ෂයේ විනය සංග්‍රහයට විරුද්ධව ක්‍රියා කරන ඕනෑම

සාමාජිකයෙකුට විරුද්ධව විනයානුකූලව ක්‍රියා කිරීමට මම පසුබට නොවෙමි. පක්ෂය තුළ ඉහළ විනයක් පවත්වා නොගෙන සමාජය තුළ විනයානුකූලව ජීවත්වීම සාමාජිකයින්ගෙන් බලාපොරොත්තු විය නොහැකිය. අනාගතයේ දී ඇතිවන එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුවක පරිපාලනය ඉතා විනිත එකක් විය යුතුය. රජය හිස නමන්නේ නීතියට පමණය. මාගේ නායකත්වය යටතේ ඇතිවන රජයකින් සෑම කෙනෙකුගේම සමෘධිය සහතික වන අතර, ජනතාව දිළිඳු බවින් මුදවා ගනු ලබනු ඇත. මාගේ ශක්තියේ උපරිමය රටට දීම වගකීම සහ යුතුකමය...."

මේ මෑත කාලයේදී දේශපාලන නායකයෙකු විසින් කරනු ලැබූ ප්‍රශස්ත ප්‍රකාශයනි. රනිල් වික්‍රමසිංහ යනු කවුරුන්දැයි මේ වැකි කිහිපය තුළ තිබේ.

රනිල් නම් අපූරු මිනිහා අධ්‍යයනය කිරීමට නම් ඔහු ළඟින් ඇසුරු නොකොට ඈත සිට ඔහුගේ කියුම් කෙරුම් දෙස බලා සිටිය යුතුය. පිදුරුතලාගල කන්දේ ප්‍රෞඪත්වය දැකීමට කන්ද නැගිය යුතු නොවේ. ඈත සිට බලන විට පිදුරුතලාගල කොතරම් සුවිශේෂ අභිමානී කන්දක්දැයි පසක් කරගත හැකිය.

රනිල් වාම් ලෙස කළිසමක් කමිසයක් හැඳ සිටින විට ඔහු කොතරම් සරළ පුද්ගලයෙකුදැයි කෙනෙකුට සිතේ. කිසිම දිනක රාජ්‍ය නායකයෙකු පය තබා නොතිබූ අමු සිංහල අව්‍යාජ ගමක් වූ බෝමුරේට ගිය ගමන ඔහුගේ සංචාරක ජීවිතයේ ඓතිහාසිකය. බෝමුරේ පිවිතුරු ගැමි ළමිස්සියන් මේ කඩවසම් "කොළඹ කොල්ලා" දෙස

ආකර්ශනිය ලෙස බලා සිටින්නට ඇත. එහෙත් සර් ජෝන් මෙන් ඔහු ඒ රුසිරු ලඳුන්ගේ රූ සපුව ඉහට ගත්තේ නැත. (රටේ තරුණයෙකුට ඇති ආත්ම නිදහස දේශපාලන නායකයෙකුට තිබිය නොහැකිය.)

විදේශ කටයුතු නියෝජ්‍ය ඇමැතිව සිටියදීත්, කර්මාන්ත සහ අධ්‍යාපන ඇමැතිවරයා ලෙස සිටියදීත් ඔහු චෝදනා නොලැබූ දේශපාලඥනයෙක් විය. ඔහුගේ අත්වල ලේ නැත. බඩේ බිජු නැත.

බටලන්ද භූමිකාවේදී රනිල්ට චෝදනා පිට චෝදනාද අපවාද සහ අවලාද නැගුණු බව අපි දනිමු. එහෙත් ඔහු ඉන්ද්‍රඛීලයක් සේ ඒ සියළු චෝදනාවන්ට මුහුණ දී නැගී සිටියේය. කොමිසමට අභියෝග කළේය. අහිංසක සමනළයෙකුට වෙඩි තැබීමට විරුද්ධ වාදිහු තුවක්කු අමෝරා ගත්හ. එහෙත් රනිල්, රනිල් ලෙස අදත් ජනතාවට මුහුණදෙයි. ධර්මයෙහි හැසිරෙන්නා ධර්මය විසින්ම රකිනු ලබන්නේය යන බුද්ධ භාෂිතය සර්වකාලීන සත්‍යකි.

# ජේ. ආර්. ගේ අත්හදා බැලීම

ජේ. ආර්. ජයවර්ධන මහතා, දකුණු කොළඹ මන්ත්‍රීවරයාව සිටියදී, එවකට හද්‍ර යෞවනයේ සිටි රනිල්ගේ දේශපාලන වෙස් බැඳීම කළේය. එතුමා, රනිල් දකුණු කොළඹ එජාප තරුණ සංවිධානයේ ක්‍රියාකාරී පුද්ගලයා බවට පත්කළේය. සූර දේශපාලකයෙකුවූ ජේ.ආර්. මේ තරුණයා තුළින් අනාගත දැවැන්තයෙකු දුටුවේය. තුන්කල් දක්නා නුවණකින් හෙබි ජේ.ආර්. තරුණ රනිල්ගේ දේශපාලන පෙකණිවැල කැපුවේ ඔහුගේම ආසනය තිඹිරිගෙය කරගනිමින්ය.

ජේ.ආර්. මේ දේශපාලන අංකුරයට නිසි අවදි බලා දිය, පොහොර දමමින්, වනස්පති වෘක්ෂයක් බවට පත් කිරිමට අවංකවම කැපවිය.

එහෙත් දකුණු කොළඹ රනිල්ට ලැබුණේ නැත. තම පරපුරේ ජය භූමිය වූ කැළණියද ඔහුට ලැබුණේ නැත. "කරතොත් කරපන් හරියට නැත්නම් පලයන් ගෙදරට" යැයි රණසිංහ ප්‍රේමදාස කිවාක් මෙන්, ජේ. ආර්. රනිල්ට දුන්නේ කැළණියට යාබද බියගමය, එය නව මැතිවරණ කොට්ඨාශයක්ද විය. රනිල් තම මාමාගේ අභියෝගය පිළිගත්තේය.



කෙනෙකු ලෙස යහපත් - දා කරඬුවෙන් ලැබ සෙත්



මහ නාහිමියන් සමඟ පිළිසඳරක...

ඔහු මුලින්ම කළේ කැළණි වෙහෙර වැඳ, එහි භික්ෂූන්ගේ ආශිර්වාදයෙන් පිරිත් නූලක් බැඳගෙන බියගම හිතවතෙකුගේ නිවසට යෑමය.

"මම අද ඉඳන් බියගම යූ.ඇන්.පී. සංවිධායක, මට ආසනය දිනන්න ඕනෙ. මොකද කියන්නෙ" යි ඔහු මිතුරාගෙන් ඇසීය.

"හරි සර්... අද ඉඳන්ම වැඩ පටන් ගනිමු..." මිතුරා කීය.

රනිල් වැඩ පටන් ගත්තේය. බියගම ආසනයේ ගෙයින් ගෙට යන්නට පෙර ඔහු සියළුම විහාරස්ථාන වලට ගියේය. භික්ෂූන් වහන්සේලා මුණ ගැසුණේය. අනතුරුව ගෙයින් ගෙට ගියේය. මේ ආකර්ශනීය තරුණ අපේක්ෂකයා කොයි කාගෙත් හිත්වලට ඉනාවක් මෙන් ආකර්ශනය විය.

රනිල් බියගම ජය ගත්තේය. ලබාගත් ඡන්ද ගණන 22,045 කි. වැඩි ඡන්ද ගණන 6769 කි.

1977 මහා මැතිවරණයෙන් ජේ.ආර්. නායකත්වය දුන් එක්සත් ජාතික පක්ෂය ජයගත් පසු ස්ථාපිත කළ කැබිනට්ටුවේ රනිල්ට ලැබුණේ විදේශ කටයුතු නියෝජ්‍ය ඇමති පදවියයි. ජේ.ආර්. තම බෑණාට තව දුර යන්නට ඉඩදී, ඇමැති කමක් දුන්නේ නැත. රනිල් තම දේශපාලන ගමන් මගේ පළමු කිලෝ මීටරය පසු කරන්නට සූදානම් විය. 1977 ජයගෙන ජේ. ආර්. පිහිටවූ ආණ්ඩුවේ ඇමැතිවරුන් අතරින් අද ජීවතුන් අතර සිටින්නේ අතක ඇඟිලි ගණනක ප්‍රමාණයකි. ඒ අතර අදත් පාර්ලිමේන්තුවේ සිටින්නේ ඇලික්

අළුවිහාරේ හා එම්.එච්. මොහොමඩ් පමණය. එම්.එච්. මොහොමඩ් පවා අද පක්ෂ නායකයා හැටියට රනිල්ට බහුමානයෙන් ගරු කරයි.

ගරු සැළකිලි යනු බලහත්කාරයෙන්, මිල මුදලින් ගත හැක්කක් නොවේ. ඒවා, කෙනෙකුගේ ක්‍රියා කලාපය හරහා නිරන්තරයෙන් ලැබිය යුතු දේවල්ය. රනිල් කරා ඒ සියල්ල පැමිණියේ නිරායාසයෙනි. ඔහු තනතුරු පදවි හඹා ගියේ නැත. තනතුරු ඔහු හඹා ආවේය.

ජේ. ආර්. ගේ අත්හදා බැලීම සර්වප්‍රකාරයෙන්ම සාර්ථක විය. රනිල් වික්‍රමසිංහ අද ඉදිරි ජනාධිපතිවරණයේදී එක්සත් ජාතික පක්ෂයේ අපේක්ෂකයාය. ගමනක් ගිය දුර කොතරම්ද? එය දෘඪ අධිෂ්ඨානය, කැපවීම, හරහාද, කටු කොහොල් මතද ආ ගමනකි.

# විනෝදකාමී සහෘදයා

රනිල් මිතුරන්ට ලැදිය. විශ්වාසවන්ත මිතුරන්ගේ සමාගමය ඔහුට ප්‍රිය ජනකය. එවැනි අවස්ථාවලදී ඔහු දේශපාලඥයෙකු නොවේ. සැබැවින්ම සහෘදයෙකි. මිතුරන්ගේ ප්‍රශ්න වලදී ඔහු අතරමැදියෙකු ලෙස කැපවෙයි.

අනුර බණ්ඩාරනායක, දිනේෂ් ගුණවර්ධන රනිල්ගේ පාසලේ හෝඩියේ සිටම ආ මිතුරන්ය. මේ තුන්දෙනා අද දේශපාලන වශයෙන් තුන් පැත්තකය. ඒ මිතුරන් තිදෙනා, දේශපාලන වේදිකාවලදී මත ගැටුම් වල යෙදුනද, මැතිසබයේදී විරෝධතා දැක්වුයේ නැත. දිනේෂ් නොසැලෙන පිළිවෙතක සිට තම පක්ෂය හෙවත් මහජන එක්සත් පෙරමුණේ අනන්‍යතාව රැක ගනී. ඔහුට ජාතික චින්තනයක්ද, පක්ෂ නායකත්වයක්ද ඇත.

අනුරට නම් මේ තුනම නැත.

රනිල් සංගීතයට බොහෝ සෙයින් ප්‍රිය කළේ යැයි පෙර සඳහන් කළෙමු. උත්තර භාරතීය රාගධාරි සංගීතය ඔහුගේ රස නහර අවදි කළේය. ක්‍රිඩාවන් ලෙස ඔහු සිත්ගත් හෝ ඇබ්බැහිවූ හෝ කිසිවක් නොවීය. සාමාන්‍යයෙන් අප දන්නා බොහෝ දේශපාලඥයින් තම විනෝද ජනක ක්‍රීඩාව

වශයෙන් තෝරා ගත්තේ ගොල්ෆ් ක්‍රීඩාවය. සර් ජෝන්, ඩඩ්ලි, ඇන්.ඇම්., ජේ.ආර්, පවා ගොල්ෆ් ක්‍රීඩා පිටියට ගියහ. ඩී.එස්. අසුන් පිට යාමට ප්‍රිය කළේය. ඩී.බී. විජේතුංග කුඹුරු කෙටුවේය. ප්‍රේමදාස දාං ඇද්දේය. රනිල්ගේ ක්‍රීඩාව ලෝක ඉතිහාසය පිරිපුන් පොත් කියැවීමය.

# නායකත්වයට ගරු කිරීම

කොළඹ රාජකීය විදුහලේ උගන්නා කාලයේදී පවා ඔහු ගුරුවරුන් අභිබවා ගියේ නැත. සාධාරණත්වය ඉදිරියේ හා පැටියෙකු මෙන් කීකරු වූවද අසාධාරණය ඉදිරියේ ව්‍යාඝ්‍රයෙකු මෙන් නැගී සිටියේය. එය ගුරුන්ට අකීකරු වීමක්ද නොවේ.

1956 ඩඩ්ලි. සේනානායක රජය කාලයේදී අධ්‍යාපන ඇමැතිවරයා වූයේ අයි.ඇම්.ආර්.ඒ. ඊරියගොල්ල මහතාය. ඊරියගොල්ල මහතා විවාදයට පත්වූ චරිතයකි. තාත්තා එස්මන්ඩ් ලේක්හවුසියේ ලොක්කා හැටියට ඩඩ්ලිගේ කුළුපග මිත්‍රයා වූවා පමණක් නොව, ඔහුගේ තිලනොලත් දේශපාලන උපදේශකයාද විය. කොටින්ම එස්මන්ඩ් ඩඩ්ලිටත් වඩා යූ.ඇන්.පී. කාරයෙකු විය.

එවකට විශ්ව විද්‍යාල සිසුවෙකු වූ රනිල්, ඊරියගොල්ලගේ අධ්‍යාපන ප්‍රතිසංවිධාන වලට එරෙහිව පෙළපාලි ගියේය. වරෙක කොළඹ මැලේ වීදියේ එවකට පිහිටි අධ්‍යාපන අමාත්‍යාංශය වට කළේය. ඊරියගොල්ල ඇමැති පුටුවේ හිඳගෙන එස්මන්ඩ්ට කතා කළේය.

"එස්මන්ඩ්, ඔබේ පුතා කට්ටියක් එක්ක ඇවිත් මගේ කන්තෝරුව වට කරල. මට එළියට යන්නවත් බෑ.. කට්ටිය ලීඩ් කරල තියෙන්නෙ ඔබේ පුතා.."

එස්මන්ඩ් පුත්‍රයා ඉදිරියේවත් දෙකට නැවෙන පුද්ගලයෙකු නොවේ. ඔහු හිතමිත්‍ර ඊරියගොල්ලට උත්තර දුන්නේය.

"එයා අනාගත දේශපාලනයට පුරුදු වෙනව. ඕවා ගණන් ගන්න එපා.. ඔබේ පුතා ගාමිණිත් ඔතන ඇති. ඕවා කොලුකම්..."

ඇත්ත වශයෙන්ම කතාව එයම විය. ඒ උද්ඝෝෂණයේදී තවත් පුතෙකු තාත්තාගේ පිළිවෙතට එරෙහිව ඒ උද්ඝෝෂණයේ සිටියේය. ඒ ඇමැති ඊරියගොල්ලගේ පුතා ගාමිණී ඊරියගොල්ලය.

තරුණ කම වෙනම කමකි. රනිල්, එදා විරුද්ධ වුනේ ඊරියගොල්ල නම් තාත්තාගේ හිතවතාට නොව, ඔහුගේ අධ්‍යාපන සංශෝධන වලටය. එහි වරදක්ද නැත. එහෙත් ඔහු හැම විටම නායකත්වයට ගරු කළේය.

ජේ. ආර්. එක්සත් ජාතික පක්ෂයේ නායකයා හැටියට කටයුතු කරද්දී බොහෝ හිතුවක්කාර තීරණ ගත් නමුදු, රනිල් තම නායකයා, අභිබවා නොගියේය. ජේ.ආර්. තම පක්ෂයේ මන්ත්‍රී වරුන්ගෙන් දින රහිත ඉල්ලා අස්වීමේ ලිපි ඉල්ලා ගනිද්දී රනිල්ද හාවක් හුවක් නැතිව තම ලිපියද බාර දුන්නේය. එම ක්‍රියාව ප්‍රජාතන්ත්‍රවාදයේ ඉම පැන්නීමක් වුවද ඔහු නායකයාගේ ක්‍රියා පටිපාටිය අනුමත නොකිරීමෙන් වුවද, එයට අනුගත විය.

රණසිංහ ප්‍රේමදාසට එරෙහි දෝෂාභියෝගය ආ අවස්ථාවේදී ඔහු තම නායකයා හැර ගියේ නැත. දෝෂාභියෝගය පරාජය කිරීමට ඔහු ඇප කැප වූවා පමණක් නොව, පක්ෂයේ අනිකුත් මන්ත්‍රීවරුන්ද ඒ සඳහා පෙළ ගැස්සවීය. ලලිත් ඇතුලත් මුදලි එ.ජා.ප.ය හැර දමා යද්දී ඔහු නවත්වා ගැනීමට අතිශයින්ම වෙහෙසවීය.

"ලලිත් ඔබ නැති යූ.ඇන්.පී ය මුදුන් මුල නැති ගහක් වගෙයි. යන්න එපා, ඔබ අපට අවශ්‍යයි."

ලලිත් පක්ෂය හැරදමා යාම එයින් නැවතුනේ නැති වුවද රනිල් පක්ෂය වෙනුවෙන් ගත් පියවර ඉතා ප්‍රශංසනීය.

ප්‍රේමදාස මහතාගේ අභාවය සිදුවූ වහාම රනිල් කළේ එවකට අගමැතිව සිටි ඩී.බී. විජේතුංග මහතා ඉතා ආරක්ෂිතව රජ ගෙදරට කැඳවාගෙන ඒමය. ව්‍යවස්ථාව අනුව ඊළඟ ජනාධිපති විය යුත්තේ අගමැති වරයා වූ විජේතුංග නිසා ඔහුගේ ජීවිතය රැක ගැනීම පළමු කටයුත්ත විය. රනිල් විජේතුංගට ජනාධිපති පුටුවේ හිඳුවා තමා අගමැති පුටුවේ වාඩිවිය.

එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව දෙවසරක් යාමටත් පෙර අයාලේ විසුරුවා මහා මැතිවරණයකට යාමට චන්ද්‍රිකා කුමාරතුංග ජනාධිපතිනිය ගත් හිතුවක්කාර තීරණය, ජනාධිපති බලතල අනිසි ලෙස පාවිච්චි කළ අවස්ථාවකි. කෙසේ හෝ එම මැතිවරණයෙන් එක්සත් ජාතික පක්ෂය පරාජයට පත්විය. අගමැති ලෙස අරලියගහ මැඳුරේ සිටි රනිල් වගක් නැතිවම තමාගේ ඇඳුම් ටික බෑගයක දමාගෙන පෞද්ගලික නිවසට ගියේය.

ජය පරාජය දෙකම ඔහුට හුරු පුරුදුය. විරුද්ධ වාදින් කියන විදියට ඔහු දොළොස් වතාවක් පරාජය විය. පරාජය ජයග්‍රහණයේ මුවදොර බව ඒ විරුද්ධ වාදීන් නොදන්නවා විය හැකිය. නැපෝලියන් බොනපාට් සිව් වතාවක් පරාජය විය. ලෙනින් ජය ගත්තේ තුන්වන විප්ලවයෙන්ය. ඒ කිසිවක් මෙයට වුවමනා නැත.

සිද්ධාර්ථ කුමාරයා ද බුද්ධත්වයට පත්වුවේ දෙවරක් පරාජය වීමෙනි. අත්තකිලමතානු යෝගයත්, කාමසුඛල්ලිකානු යෝගයත් අත්හදා බලා, සාවුරුද්දක් දුෂ්කරක්‍රියා කොට පරාජයට පත්වී අවසන මැදුම් පිළිවෙතින් බුද්ධ රාජ්‍යය දිනා ගති.

පිරිසිදු පැහැදිලි බෞද්ධයෙකු ලෙස රනිල් ජය පරාජය දෙකේදීම බුදු වදන් සිහිපත් කළේය. ඒ අනුව ඉවසීම හා සැනසීම පුරුදු කර ගත්තේය. කළකිරීම්, දුක්ඛ, දෝමනස්සයන්, සමනය කර ගත්තේය. මේවා සළකා බලන විට ඒ ගති ලක්ෂණද ජේ.ආර් ගෙන් ලැබුණු ඒවා විය යුතුය.

මිනිසාගේ පරම යුතුකම මිනිසාට සේවය කිරීමය යන්න ඇස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මහතාගේ සුප්‍රකට කියමනකි. එහි විවාදයක් නැත. රනිල්ගේ මතය එයටත් වඩා ඔබ්බට ගිය එකකි. මිනිසාගේ, පරම යුතුකම මිනිස්කමට ගරු කිරීමය. ඒ රනිල් සිතන හැටිය. මිනිස් කමට ගරු නොකරන්නාට මිනිසාට සේවය කළ නොහැකිය.

දේශපාලනයේදී සදාකාලීන මිතුරන්ද සතුරන්ද නැත. රනිල්ටද ඒ න්‍යාය සාධාරණය. ඔහුට සතුරෝද මිතුරෝද සිටිති. කාටත් එසේය. එහෙත් ඔහු මිතුරන් කෙරෙහි සහෘද වන්නා සේම සතුරන් කෙරෙහිද සහෘද වන්නේය. එය බුදු දහමෙන් ලද ආභාසයයි.

PRESIDENTIAL SECRETARIAT
LIBRARY



බුදු පුදට යන්නේ - දැහැමි බව මතුවන්නේ



උතුම් බෞද්ධ පවුලක් - තෙරුවන් වඳින මොහොතක්

# නායකත්වය සඳහා සුදුසුකම්

රනිල් වික්‍රමසිංහ පක්ෂයක නායකයෙකු වීමට පෙරුම්පුරා නියත විවරණ ලැබුවේද නොවේ. ඔහු නීති විද්‍යාලයට ඇතුලත් වූයේ නීතිවේදීයෙකු වී උසාවියේ තර්ක විතර්ක කිරීමටය. එහෙත් දෛවය එයට ඉඩ දුන්නේ නැත. අහඹුවකින් ඔහු දේශපාලන පොර පිටියේ කහවේනෙකු බවට පත්විය.

දේශපාලනයේ යෙදෙන බොහෝ දෙනා නීතිඥයින්ය. එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක, කොල්වින් ආර් ද සිල්වා, ජේ.ආර්. ජයවර්ධන, ගාමිණී දිසානායක, ලලිත් ඇතුලත්මුදලි සහ තවත් බොහෝ දෙනා නීතිඥයෝය. රනිල්ගේ ප්‍රතිවාදියා වූ මහින්ද රාජපක්ෂද නීතිඥයෙකි.

එහෙත් නිතිඥයෙකු වීම දේශපාලන නායකයෙකු වීමට සුදුසු කමක්ද?

එයට වඩා සුදුසුකම් තිබිය යුතුය. රනිල්ට ඇත්තේ එවැනි සුදුසුකම්ය.

ඔහු කීර්තිමත් පරපුරක වර්තමාන පුරුකය. ඒ පරපුර රටට ජාතියට සමයට බොහෝ මෙහෙවර කර තිබේ. ඒ එක සුදුසුකමකි.

ඉවසීම සහ ඇහුම්කන්දීම රනිල්ට පුරුදුය. ඔහු වැටී වැටී කෙලින් සිටගත් පුද්ගලයෙකි. තනි කකුලෙන් නොව කකුල් දෙකෙන් හිටගත් පුද්ගලයෙකි. රන් හැන්දෙන් කිරි කඳුල තොල ගෑවද, විල්ලුද පළස් මත දෙපා ගැටුනද, ඔහු සැබැවින්ම නැති බැරි මිනිසාගේ පැත්තේය. අධිවේගය ඔහුගේ පිළිවෙත නොවේ. ඉක්මණින් දුවමින් හති වැටී නවතින්නට රනිල් සූදානම් නැත. ජේ.ආර්. ද එසේය. ජේ.ආර්. දිව්වේ නැත. රනිල් ද දුවන්නේ නැත. එහෙත් නොනවතින ගමන සංවරයෙන් යන්නේය. ලෝකය ජයගත් බොහෝ යුග පුරුෂයින් එසේය. කාල්මාක්ස් "දාස් කැපිටාල්" ලිව්වේ ඔහුගේ තරුණ වියේදී නොවේ. පණස්වන කඩුල්ලද පැන බුද්ධියෙන් පරිණත වූවාට පසුවය. එහෙයින් බොහෝ දෙනා කියන විදියට රනිල් තරුණ නායකයෙකු නොවේ. පරිණත නායකයෙකි. රටක නායකයා වීමට එය තවත් සුදුසු කමකි.

නායකයෙකුට ඇසූ පිරුතැන් තිබිය යුතුය. ජගත් විෂය අතැඹුලක් සේ පසක් විය යුතුය. එය උගත් කම නොව ප්‍රාඥා විභූතියයි. රනිල් එයින්ද පරිපූර්ණය.

ඔහු නිකම්ම නායකයෙකු නොවේ. ගැල් සාත්තු නායකයෙකි. මරු වැලිකතරේ තරු එළියෙන් ගැල් පෙලට මග පෙන්වන ගැල් සාත්තු නායකයෙකි. තම පිරිවර රැක ගනිමින්, ඔවුන්ට නිසි උපදෙස් දෙමින් "තමා සම්මිතයේ පිහිටි" නායකයෙකි.

රනිල් චතුර කථිකයෙකි. ජේ.ආර්. මෙන්ම ඉතා සංවේදීව, පැහැදිලිව කතා කරන්නෙකි. කොල්වින් ආර්. ද සිල්වාද මේ රටේ සිටි චතුර කථිකයෙකි. එහෙත් රනිල් කොල්වින් මෙන් වේදිකාවේ කස්තිරම් අල්ලන්නේ නැත.

ඔහුගේ වේදිකා ශබ්ද කෝෂය ඉතා නිරවුල්ය, පැහැදිලිය. වක්‍රෝත්ති නැත. ව්‍යාංගාර්ථ නැත. එහෙත් උපමා උපමේය ඇත. ඒ සුදුසු කමින්ද රනිල් පරිපූර්ණය.

යහපත් පවුල් ජීවිතයක් ඇති හෙතෙම නිතර සිය බිරිඳගේ සිතැඟි පරිදි කටයුතු කරයි. බිරියගේ සිතැඟි පරිදි කටයුතු කිරීම හොඳ සැමියෙකුගේ ලක්ෂණයකි. එයද තවත් සුදුසු කමකි.

රනිල් දුක් ගන්නා රාළ කෙනෙකු මෙන් තම සහචරයන්ගේ ගැටළු වලට කන්දෙයි. ඒවාට විසඳුම් දෙයි. ඇහුම්කන් දෙයි. විමසිලිමත් වෙයි. එයද හොඳ නායකයෙකුගේ ගති ලක්ෂණයකි.

ඔහු කෝප වන්නේද කෝන්ති ගන්නේද නැතැයි ළඟින් ඇසුරු කරන්නෝ කියති. එය ඇත්තක් නම් රනිල් යනු බෝසත් චරිතයකි. එහෙත් ඔහු සිරිසඟබෝ මෙන් හිස දන් දෙන බෝසතෙක් නොවේ.

චණ්ඩාශෝක ධර්මාශෝක වූයේ නිග්‍රෝධ සාමණේරයන්ගේ බණ අසාය. ඒ මහා අධිරාජ්‍යවාදියෙකි. රනිල් අධිරාජ්‍යවාදියකු නොවේ. පුංචි රටක පුංචි නායකයෙකි. ඔහු බලය හඹා නොගිය, බලයට කෑදර නොවූ කෙනෙකි.

සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය රෝද පුටුවේ හිඳගෙනත් බලය අතහරින්නට අකමැති වූවාය. චන්ද්‍රිකා ජනාධිපතිනියද එසේය. එහෙත් රනිල් ආණ්ඩුව පරාජය වූ සැණින් අගමැති කමෙත් ඉල්ලා අස්වීමේ ලිපිය ලේකම් අතට දී අරලිය ගහ මැදුරෙන් නික්ම ගියේය. ඒ අතින් ඔහු අද සිටින දූවැන්ත ප්‍රජාතන්ත්‍රවාදී නායකයාය.

බලය යනු කුඩැල්ලෙකු නොවේ. එල්ලී කාගෙන සිටින කුඩැල්ලා ගලවා දැමීමද අසීරුය.

# ජනාධිපති අපේක්ෂකයා ලෙස

රනිල් වික්‍රමසිංහ එක්සත් ජාතික පක්ෂයේ ජනාධිපති අපේක්ෂකයා ලෙස තහවුරු කොට හමාරය. දන් ඔහු රටපුරා ජනතාව දනුවත් කරමින් සිටියි. ඒ සඳහා ඔහු විපක්ෂ නායක කාර්යාලයේවත්, පෞද්ගලික නිවසේවත් සාද පවත්වන්නේ නැත. විස්කි, බ්‍රැන්ඩි බෝතල් කඩන්නේ නැත. එහෙත් සෑම තත්ත්පරයක් පාසාම සාකච්ඡාවේය. අවදියෙන්ය, ක්‍රියාත්මකය.

ඔහු ජනාධිපතිවරණයට මුහුණ දෙන්නේ ප්‍රතිපත්ති ප්‍රකාශනයත් සමගය. ඔහු තරහ වඩින්නේ ජනතා විශ්වාසය ඇතිවය. ඔහු ජනතාව අතරට යන්නේ ඉතා වාම් සරල පුද්ගලයෙකු ලෙසටය. අත්දිග කමිසය හෝ ටියුනිප් කමිසයක් හැඳ කළිසමකින් සැරසී දකුණතේ පිරිත් නූලක් බැඳගෙනය.

ඔහුගේ වේදිකා කතාව වැල්වටාරම් වලින් තොර තර්කයට හසුවන, ජනතා හදවත් වලට කරන ඇමතුමකි. පුරසාරම්, පුරාජේරු, අටුවා ටීකා නැති කතාවකි. එය පොදු ජන හද ගැස්මේ රිද්මයට අනුගතය. එහෙයින්ම රනිල්ට මෙවර ජයග්‍රහණය අතැඹුලක් සේ පැහැදිලිය. ඉර හඳ සේ ස්ථිරය.

රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවීම යනු මේ රටේ ජනතාවගේ ජයග්‍රහණයයි. තුන් කල් දක්නා ජනාධිපතිවරයෙකු

ලෙස ඔහු රට පෙරට ගෙන යන බැව් අපට විශ්වාසය. උතුර නැගෙනහිර යුද බිය නවත්වාලූ ඔහුට ඒ ප්‍රශ්නය සහමුලින්ම උපුටා දමන්නට හැකියාවක්, ශක්තියක් තිබේ. ජාත්‍යන්තර සහයෝගයද තිබේ.

ලෝකයේ මහා බලවතා වූ ජෝර්ජ් බුෂ් කරට අතදමාගෙන සුහදව මිතුරු ලීලා පවත්වන ලංකාවේ එකම දේශපාලකයා රනිල්ය. චන්ද්‍රිකා ජනාධිපතිනියටවත් බුෂ් හමුවන්නට නොහැකිය.

ඔහුට වැඩ පිළිවෙලක්ද, දර්ශනයක්ද, ප්‍රතිපත්තියක්ද තිබේ. වී ගොවියාගේ සිට මහ බැංකු පරිපාලකයා දක්වා මෙහෙයවන්නට ඔහුට පිළිවෙතක් ඇත. එම නිසා රනිල්, මේ ජනාධිපති තරඟයෙන් ජය ගත යුතුමය. ඔහු ජයග්‍රහණය කරවීම රටේ ජනතාවගේ පරම යුතුකමකි.

පැහැදිලි බෞද්ධයෙකු ලෙස මහා සංඝරත්නයේ ආශිර්වාදය ලබා තෙරුවන් සරණින් තිස්තුන්කෝටියක් දෙවි රැකවරණින්, ඔහු යන මග දහසක් මල් පිපේවා යන්න අපගේද, ප්‍රාර්ථනයයි.

රනිල් වික්‍රමසිංහ අසහාය ප්‍රෞඪ නායකයාණෙනි ! ඔබට චිරං ජයතු

**කලට වැසි වසීවා**
**අවු කොවු සරු කෙරේවා**
**රජු දැහැමි වේවා**
**නිවී යුද ගිනි රට දිනේවා**



නිරාජ් වික්‍රමසිංහ මහතා



චන්න වික්‍රමසිංහ මහතා



ප්‍රතිපත්ති මෙන්ම ගුණගරුක භාවයෙන් පෝෂනය වූ එස්මන්ඩ් වික්‍රමසිංහ-නාලනී වික්‍රමසිංහ යුවලගේ දරු-දැරියන් කුඩා අවදියේදී ගත් ඡායාරූපයක්...ශාන්, රනිල්, නිරාජ්, ශානිකා